## මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

# කාර්ය සාධන වාර්තාව
# 2020

තැ.පෙ.අංක 533 – 341, ඇල්විටිගල මාවත, කොළඹ 05

# පටුන

පිටු අංකය

**1. පරිච්ඡේදය**

1.1 දෙපාර්තමේන්තු පසුබිම 1

1.2 දෙපාර්තමේන්තුවේ දැක්ම / මෙහෙවර / අරමුණු 2

1.3 දෙපාර්තමේන්තුවේ කාර්යභාරය 2

1.4 සංවිධාන ව්‍යුහය / කාර්ය මණ්ඩලය 3 - 04

1.5 දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු 5 – 11

**2. පරිච්ඡේදය**

2.1 ධාවනය කළ හැකි මෝටර් වාහන නව ලියාපදිංචිය 12 - 18

2.2 වාහන හිමිකම් පැවරීම ලියාපදිංචි කිරීම 19

2.3 රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ සේවාව 20 - 21

2.4 මෝටර් වාහන සම්බන්ධ කාර්මික සේවාව 21 - 22

2.5 වායු විමෝචන තත්ත්වය නියාමනය 23 - 24

2.6 මාර්ග ආරක්ෂාව පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය 25

**3. පරිච්ඡේදය**

3.1 මූල්‍ය කාර්ය සාධක ප්‍රකාශය 26 - 27

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 28 - 29

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 39 - 31

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 31

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 31 - 32

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 32

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය ලද ප්‍රතිපාදන 33

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 33

3.9 විගණකාධිපතිගේ වාර්තාව 33

**4. පරිච්ඡේදය**

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක 34 - 35

**5. පරිච්ඡේදය**

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු 36 - 38

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 38 - 39

**6. පරිච්ඡේදය**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 40

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ඇත්තේ කෙසේද 40

6.3 මානව සම්පත් සංවර්ධනය 41

**7. පරිච්ඡේදය**

අනුකූලතා වාර්තාව 42 - 47

**ඇමුණුම 01**

## මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ගේ පණිවුඩය

මෝටර් වාහන ලියාපදිංචිය හා රියදුරු බලපත්‍ර නිකුත් කිරීම අරමුණු කර ගනිමින් 1928 වර්ෂයේදී ආරම්භ කරන ලද මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මේ වන විට අවුරුදු 95 ක දීර්ඝ ගමනක් පැමිණ තිබේ. ඒ යටතේ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන මැන බැලීම සඳහා සකස් කෙරෙන කාර්ය සාධන වාර්තාව මෙවර නිකුත් කෙරෙනු ලබන්නේ 91 වන වරට වීම සතුටට කරුණකි. මෝටර් රථ වාහන නව ලියාපදිංචි කිරීම, හිමිකම් පැවරීම ලියාපදිංචිය, රියදුරු බලපත්‍ර නිකුත් කිරීම, මෝටර් වාහන සම්බන්ධ කාර්මික සේවාව, මාර්ග ආරක්ෂාව හා වායු විමෝචන තත්ත්ව නියාමනය කිරීම යනාදිය මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයන් වේ.

2020 වර්ෂයේ ප්‍රගතිය සලකා බැලීමේදී, නව ලියාපදිංචි මෝටර් වාහන සංඛ්‍යාව 202,628 ක් විය. මෙම වසරේ දී සිදු කරන ලද වාහන පැවරුම් සංඛ්‍යාව 522,628 ක් වන අතර නිකුත් කරන ලද රියදුරු බලපත් ප්‍රමාණය 708,909 ක් වේ. ඒ අනුව වසර අවසානය වන විට ශ්‍රී ලංකාවේ සම්පූර්ණ මෝටර් රථ ගහණය 8,297,852 ක් වේ. A ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් ලෙසින් අප දෙපාර්තමේන්තුව 2020 වර්ෂයේ රු.මි. 9,027 ක ආදායමක් උපයා ඇති අතර, දෙපාර්තමේන්තුවේ පුනරාවර්ථන වියදම රු.මි. 1,484 කි.

මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරයන් රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලව ඉටු කිරීමේ දී, මෝටර් රථ නියාමනයෙහි සිදු කරන ලද අවශ්‍ය මඟ පෙන්වීම් වෙනුවෙන් ප්‍රවාහන අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමන්ට හා වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ ගරු රාජ්‍ය අමාත්‍යතුමන්ටත්, ඒ සඳහා යටිතල පහසුකම් හා උපදෙස් ලබා දෙමින් සහයෝගය ලබා දුන් අමාත්‍යාංශ ලේකම්තුමන්ලාටත් මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි. එසේම දෙපාර්තමේන්තු කාර්යභාරය ඉටු කිරීමෙහිලා අවශ්‍ය සහයෝගය ලබා දුන් දෙපාර්තමේන්තුවට සම්බන්ධ සියලු ආයතන වලටත්, දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකර ගැනීමෙහිලා කැපවීමෙන් යුතුව කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ලබා දුන් දෙපාර්තමේන්තුවේ සියලු කාර්ය මණ්ඩලයටත් ස්තූතිය පුද කරමි. දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගනිමින් ප්‍රමිතිගතව සහ තාක්ෂණිකව මෙහෙයවන ක්‍රියාවලියකින් මෝටර් නියාමනය හා පාලනය කරන ප්‍රතිචාරාත්මක සංවිධානයක් තුළින් විශිෂ්ඨත්වය කරා යන රාජ්‍ය සේවයේ විශ්වාසනීයම සේවා සපයන්නා බවට පත් වීම සඳහා කටයුතු කිරීම අප දෙපාර්තමේන්තුවේ ඉදිරි බලාපොරොත්තුවයි.

**සුමිත් සී.කේ. අලහකෝන්**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්

# 1 පරිච්ඡේදය

## මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

### 1.1 දෙපාර්තමේන්තු පසුබිම

ශ්‍රී ලංකාව තුළ වාහන ලියාපදිංචි කිරීම හා රියදුරු බලපත් නිකුත් කිරීම අරමුණු කර ගනිමින් 1916 අංක 14 දරන පනත ගෙන එන අතර, එමගින් පොලිස්පතිවරයා යටතේ එම කටයුතු ආරම්භකර තිබේ. පසුකාලීනව 1925 මේ සම්බන්ධයෙන් පිහිටුවනු ලබන විශේෂ කමිටුවක නිර්දේශ අනුව 1927 අංක 20 දරන මෝටර් කාර් ආඥා පනත නීතිගත කිරීමෙහිලා තවත් වැදගත් සන්ධිස්ථානයකි. මේ යටතේ මෝටර් රථ හා රියදුරන් ලියාපදිංචි කිරීම හා වාර්ෂික ආදායම් බලපත් නිකුත් කිරීමට පෙර කුලී කාර් සහ ලොරි පරීක්ෂා කිරීම අරමුණු කර ගත් අතර, 1927 ගෙන එනු ලබන මෙම පනත යටතේ 1928 ජනවාරි 01 දින මෝටර් රථ රෙජිස්ට්‍රාර්වරයකු යටතේ මෝටර් රථ රෙජිස්ට්‍රාර් කාර්යාලය ආරම්භ කරන ලදී.

මෙම ගමන් මගෙහි තවත් සුවිශේෂීම සන්ධිස්ථානයක් වන්නේ වර්ෂ 1951 අංක 14 දරන මෝටර් වාහන පනත මගින් දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපනය කිරීමයි. ශ්‍රී ලංකාව තුළ මෝටර් වාහන ලියාපදිංචිය, නියාමනය, රියදුරු බලපත් නිකුත් කිරීම, මාර්ග ආරක්ෂාව හා පරිසර හිතකාමී වාහන භාවිතය යන අරමුණු පෙරදැරිව කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැපයීම අද වන විට දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු අතර වේ.

වර්තමානය වන විට ශ්‍රී ලංකාව තුළ වාහන භාවිතයේ සීඝ්‍ර වැඩිවීමත් සමගම පුළුල් වී ඇති දෙපාර්තමේන්තු කාර්යන් ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ඉටු කිරීම සඳහා නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලය කේන්ද්‍ර කර ගනිමින්, වේරහැර කාර්යාලය හා සෑම දිස්ත්‍රික් කාර්යාලයක් හරහාම දෙපාර්තමේන්තුමය සේවාවන් සැලසීම සිදු කරනු ලබයි. මේ අනුව වර්තමානය වන විට දිස්ත්‍රික් කාර්යාල කිහිපයක් මාර්ගගත (online) සම්බන්ධතාව මත ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තුව සමත් වී ඇත.

සියලුම දිස්ත්‍රික් කාර්යාල මාර්ගගත (online) සම්බන්ධතාව මගින් නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලය සමඟ සම්බන්ධවීමෙන්, ග්‍රාමීය / ප්‍රාදේශීය මට්ටමේ සේවාලාභීන්ගේ අපේක්ෂාවන් / අවශ්‍යතා කඩිනමින් ඉටුකිරීමත්, නවීන පහසුකම් සහ නව තාක්ෂණය තුළින් සේවාලාභී අපේක්ෂාවන් වඩා පහසු කරලීමත් දෙපාර්තමේන්තුවේ ඉදිරි අභිලාෂයන් අතර ප්‍රධාන වේ.

## 1.2

### දෙපාර්තමේන්තුවේ දැක්ම

**“ප්‍රමිතිගතව සහ තාක්ෂණිකව මෙහෙයවන ක්‍රියාවලියකින් මෝටර් රථ නියාමනය හා පාලනය කරන ප්‍රතිචාරාත්මක සංවිධානයක් තුළින් විශිෂ්ඨත්වය”**

### දෙපාර්තමේන්තුවේ මෙහෙවර

**“සාමූහික ප්‍රයත්නය හා නව තාක්‍ෂණය කාර්යක්ෂමව යොදා ගනිමින් මෝටර් වාහන පනත හා අනෙකුත් නීති රෙගුලාසි ක්‍රියාත්මක කිරීම තුළින් ප්‍රතිචාරාත්මක සංවිධානයක් නිර්මාණය කිරීම.”**


### දෙපාර්තමේන්තුවේ අරමුණු

- ✓ ඵලදායී හා කාර්යක්ෂම තාක්ෂණයන්ගෙන් දෙපාර්තමේන්තුව සන්නද්ධ කිරීම
- ✓ වැඩිදියුණු කරන ලද යටිතල පහසුකම් තුළින් උසස් පාරිභෝගික සේවාවක් ලබාදීම
- ✓ ඵලදායී හා කාර්යක්ෂම කාර්යාල කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කිරීම
- ✓ සේවා ක්‍රියාවලි වැඩිදියුණු කිරීමට අදාළ රෙගුලාසි ක්‍රමවත්ව ක්‍රියාත්මක වීම තහවුරු කිරීම

## 1.3 දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

1. ධාවනය කළ හැකි මෝටර් වාහන නව ලියාපදිංචිය
2. වාහන හිමිකම් පැවරීම ලියාපදිංචිය
3. රියදුරු බලපත්‍ර නිකුත් කිරීම
4. මෝටර් වාහන සම්බන්ධ කාර්මික සේවාවන් සැපයීම
5. වායු විමෝචන තත්ත්වය නියාමනය
6. මාර්ග ආරක්ෂාව පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය

## 1.4 සංවිධාන ව්‍යුහය


DEPARTMENT OF MOTOR TRAFFIC
ORGANIZATIONAL STRUCTURE
COMMISSIONER GENERAL OF MOTOR TRAFFIC
GA/DS
CFO
CA
ACC
C/IA
PD (E)
S.K
S/O
STA
Commissioner (Investigation)
Commissioner (IT)
Commissioner (Development)
Commissioner (D/L)
Commissioner (Administration)
DC/AC (IT)
A/D (IT)
P.R.G.M
DC/AC
A/O (D.E)
A/O
C/EMV
S/EMV
EMV
EMV/SO
DC/AC (Technical)
AC/DC (District)
DC/AC (Admin)
A/O (Adin)
Legal Officer
S.T.O
DISINATION ABBER
C.F.O –CHIEF FINANCIAL OFFICER
D.C - DEPUTY COMMISSIONER
D.D.C/A.C- DISRICK DEPUTY/ASSISTANT COMMISSIONER
A.C- ASITANT COMMISSONER
P.D(E)- PROJECT DIRECTOR
CA- CHIEF ACCOUNTANT
C/IA -CHIEF INTERNAL AUDITOR
ACC - ACCOUNTANT
GA/DS - GOVERNMENT AGENT/DISTRICT SECRETARY
A.O(A.D) - ADMINISTRATIVE OFFICER (ADMIN)
A.O(D.E) - ADMINISTRATIVE OFFICER (DEVELOPMENT)
L.O-LEGAL OFFICER
S.T.O- STATISTICAL OFFICER
S.K- STORE KEEPER
S.O- SUPERVISING OFFICER
S.E.M.V- SENIOR EXAMINER OF MOTOR VEHICLE
E.M.V - EXAMINER OF MOTOR VEHICLE
A.D(IT) - ASSISTANT DIRECTOR(IT)
P.R.G.M- PROGRAMMER
STA -STAFF
DMT

## කාර්ය මණ්ඩලය
## මාණ්ඩලික නිලධාරී කාර්ය මණ්ඩලය - 2020

- මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් - සුමිත් සී. කේ. අලහකෝන් මයා
- ප්‍රධාන මූල්‍ය නිලධාරී - එස්.එල්. හෙට්ටිආරච්චි මයා
- කොමසාරිස් (පාලන) - සුසන්ත ජයතිලක මයා
- කොමසාරිස් (සංවර්ධන) - ඩී.කුසලානි ද සිල්වා මිය
- කොමසාරිස් (විමර්ශන) - එච්.එම්.ජේ.එම්. හේරත් මයා
- කොමසාරිස් (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) - ඩී.ටී.එෆ්. සුරවීර මයා
- කොමසාරිස් (රියදුරු බලපත්) - වසන්ත ගුණරත්න මයා
- ප්‍රධාන ගණකාධිකාරී - යූ.ඩී.එන්.එස්. සිරිවර්ධන මිය
- ප්‍රධාන අභ්‍යන්තර විගණක - ටී.ඕ.ආර්. වනිගරත්න මයා
- ව්‍යාපෘති අධ්‍යක්ෂ (වායු විමෝචන පරීක්ෂණ) - ආර්.එල්.මොලගොඩ මයා
- නියෝජ්‍ය කොමසාරිස් (පාලන) - කේ.කේ. ෆොන්සේකා මිය
- නියෝජ්‍ය කොමසාරිස් (කාර් පැවරුම්) - ඩබ්.ඒ.ආර්. වික්‍රමසිංහ මයා
- නියෝජ්‍ය කොමසාරිස් (යාපනය) - වයි. පරම්තාමන් මයා
- නියෝජ්‍ය කොමසාරිස් (යතුරු පැදි න.ලි.ප.) - බී.ඒ.ඩී.ඩී.ඩබ්. සිරිවර්ධන මිය
- නියෝජ්‍ය කොමසාරිස් (වෙළඳ වාහන පැවරුම් ) - ඩී.ඩී.සී. අතුකෝරල මයා
- සහකාර කොමසාරිස් (බස් හා ඉඩම් වාහන පැවරුම්) - එම්.පී. කසුන් ප්‍රමෝදිත් මයා
- සහකාර කොමසාරිස් (කුරුණෑගල) - ඊ.ජී. වික්‍රමසිංහ මයා
- සහකාර කොමසාරිස් (යතුරු පැදි පැවරුම්) - ආර්.ඩී.පී. වෙඩික්කාර මිය
- සහකාර කොමසාරිස් (වෙළඳ වාහන න.ලි.ප II) - එම්.එල්.එන්. සඳමාලි මිය
- සහකාර කොමසාරිස් (වෙළඳ වාහන න.ලි.ප I) - එච්.ඩී. සතරසිංහ මයා
- සහකාර කොමසාරිස් (තොරතුරු තාක්ෂණ/ත්‍රීවිල් න.ලි.) - කේ.කේ.කේ. ෆොන්සේකා මිය
- සහකාර කොමසාරිස් (අනුරාධපුර) - ආර්.එම්. ධර්මසිරි ජයවර්ධන මයා
- සහකාර කොමසාරිස් (ගම්පහ) - එම්.එච්.පී.එල්.ඒ. විජයපාල මයා
- සහකාර කොමසාරිස් (හම්බන්තොට) - එල්.ජී.පී. ප්‍රසාද් මයා
- සහකාර කොමසාරිස් (වේරහැර) - පී.කේ. සංජීවනි මිය
- ගණකාධිකාරී (ආදායම්) - ඩබ්.කේ.පී.එච්.එන්.එම්. රුද්‍රිගෝ මයා
- ගණකාධිකාරී (ගෙවීම්) - එච්.එන්.එස්. පෙරේරා මිය
- සහකාර කොමසාරිස් (කාර්මික) - ජේ.ඒ.එස්. ජයවීර මයා
- සහකාර අධ්‍යක්ෂ (තො.සං. තාක්ෂණ) - පී.ඩබ්.පී.බී. ඊරියගම මයා
- නීති නිලධාරී - කේ.අයි. යෝගවන්ද්‍ර මයා
- පරිපාලන නිලධාරී (පාලන) - ඒ.එම්.සී.ජේ. අදිකාරි මිය
- පරිපාලන නිලධාරී (වේරහැර) - යූ.අයි. මුණසිංහ මිය
- පරිපාලන නිලධාරී (වේරහැර) - කේ. ඉන්ද්‍රාදේවි මිය

## 1.5 දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්තුමාගේ මඟ පෙන්වීම මත කොමසාරිස් (පාලන) විසින් දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු මෙහෙයවනු ලබන අතර, කොමසාරිස් (සංවර්ධන) විසින් සංවර්ධන කටයුතු මෙහෙයවනු ලබයි. දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණික අංශය කොමසාරිස්වරයකු යටතේ පාලනය වන අතර, දෙපාර්තමේන්තු විමර්ශන කටයුතු ද ඒ සඳහා පත් කළ කොමසාරිස්වරයකු යටතේ ක්‍රියාත්මක වේ. ඊට අමතරව වේරහැර උප කාර්යාලය ද ප්‍රධාන කාර්යාලය හා සම්බන්ධ වෙමින් කොමසාරිස්වරයකුගේ මූලික මඟ පෙන්වීම යටතේ ක්‍රියාත්මක වන අතර, අනෙකුත් දිස්ත්‍රික් කාර්යාල දිස්ත්‍රික් ලේකම්වරයකුගේ හෝ සහකාර කොමසාරිස්වරයකුගේ පාලනයට යටත්ව පවතී. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය නාරාහේන්පිට පිහිටා ඇති අතර, වේරහැර උප කාර්යාලය හා දීප ව්‍යාප්තව ස්ථානගත කර ඇති දිස්ත්‍රික් කාර්යාල, ප්‍රධාන කාර්යාලය කේන්ද්‍ර කර ගනිමින් මෙහෙයවනු ලබයි.

**ප්‍රධාන කාර්යාලයේ ශාඛාවන්**

i. කොමසාරිස් ජනරාල් කාර්යාලය
ii. ආයතන ශාඛාව
iii. සංවර්ධන ශාඛාව
iv. ගිණුම් ශාඛාව
v. පරිගණක හා තොරතුරු තාක්‍ෂණ ශාඛාව
vi. අභ්‍යන්තර විගණන හා විමර්ශන ශාඛාව
vii. නීති ශාඛාව
viii. සුබෝපභෝගී බදු ශාඛාව
ix. තැපැල් ශාඛාව
x. වෙළඳ වාහන නව ලියාපදිංචි ශාඛාව I
xi. වෙළඳ වාහන නව ලියාපදිංචි ශාඛාව II
xii. ත්‍රීරෝද රථ නව ලියාපදිංචි ශාඛාව
xiii. යතුරු පැදි නව ලියාපදිංචි ශාඛාව
xiv. මෝටර් කාර් පැවරුම් ශාඛාව
xv. වෙළඳ වාහන පැවරුම් ශාඛාව
xvi. ලොරි පැවරුම් ශාඛාව
xvii. බස් හා ඉඩම් වාහන පැවරුම් ශාඛාව
xviii. ත්‍රීරෝද රථ පැවරුම් ශාඛාව

xix. යතුරු පැදි පැවරුම් ශාඛාව

xx. කාර්මික ශාඛාව

xxi. අංක තහඩු (කොළඹ) ශාඛාව

xxii. අංක තහඩු (පිට පළාත්) ශාඛාව

xxiii. ලේඛනාගාර I

xxiv. ලේඛනාගාර II

xxv. සංඛ්‍යාලේඛන ශාඛාව

**ප්‍රධාන කාර්යාලයේ අංශයන්ගේ කාර්ය භාරය**

**I. කොමසාරිස් ජනරාල් කාර්යාලය**

සේවාලාභී මහජනතාවගේ අවශ්‍යතා පදනම් කර ගනිමින්, එකී අවශ්‍යතාවයන් සපුරාලීම වෙනුවෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්තුමාගේ කාර්යභාරයන් සඳහා සහාය වීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වන අතර, මෙම අංශය මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්තුමාගේ මඟ පෙන්වීම ඔස්සේ ක්‍රියාත්මක වේ.

**II. ආයතන ශාඛාව**

"සුහවාදී සිතුවිලි තුළින් ඵලදායී රාජ්‍ය සේවයක්" යන ආංශික දැක්ම ඔස්සේ ආයතන අංශය ක්‍රියාත්මක වේ. දෙපාර්තමේන්තුවේ පරිපාලනය භාර කොමසාරිස්ගේ මඟ පෙන්වීම මත මූලික වශයෙන් දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්ය මණ්ඩලයේ ආයතන හා පරිපාලන කටයුතු ඉටු කිරීම සහ අනෙකුත් යටිතල පහසුකම් ඇතුළු දෙපාර්තමේන්තුවේ නඩත්තු කටයුතු මෙම අංශයේ ප්‍රධාන කාර්යය වන අතර, කාර්ය මණ්ඩලය පත් කිරීම්, මාරු කිරීම්, උසස් කිරීම්, විශ්‍රාම ගැන්වීම, සේවා දීර්ඝ ලබා දීම, විනය කටයුතු සිදු කිරීම සහ පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම ද, ඊට අමතරව වැටුප් වර්ධක අනුමත කිරීම, විවිධ ණය වර්ග අනුමත කිරීම, අග්‍රහාර රක්ෂණ බිල්පත් නිරවුල් කිරීම, ජලය, දුරකථන, විදුලි බිල්පත් පියවීම ද මෙම අංශය තුළින් සිදුකරනු ලබන කාර්යයන් වේ. තැපැල් ශාඛාව හා ලේඛණාගාර I, ලේඛණාගාර II යන අංශයන් වල කටයුතු ද ආයතන අංශයේ පරිපාලනයට යටත්ව ක්‍රියාත්මක වේ.

**III. සංවර්ධන ශාඛාව**

"තෘප්තිමත් සේවක සමූහය තුළින්, ඉහළ මහජන ප්‍රසාදයක්" යන ආංශික දැක්ම ඔස්සේ මෙම අංශයේ කටයුතු ක්‍රියාත්මක වේ. සංවර්ධන අංශය භාර කොමසාරිස්ගේ මඟ පෙන්වීම මත මෙම අංශය ක්‍රියාත්මක වන අතර, වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ සංවර්ධන

වැඩසටහන් ක්‍රියාවට නංවමින් කාර්යාල පද්ධතියේ ඉදිකිරීම් හා අළුත්වැඩියා කටයුතු පවත්වාගෙන යාම, සේවක අභිප්‍රේරණය සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, දෙපාර්තමේන්තුවේ සියළු අංශවල සහ ප්‍රාදේශීය කාර්යාල වල ප්‍රගතිය සමාලෝචනය, අමාත්‍යාංශ හා වෙනත් අංශවලට යොමු කළ යුතු සියළුම ප්‍රගති වාර්තා, අයවැය වාර්තා, කාර්ය සාධන වාර්තා, ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම, ඵලදායිතා ප්‍රවර්ධන කටයුතු වැනි දෙපාර්තමේන්තුවේ වැදගත් කාර්යයන් රැසක් මෙම අංශය මගින් සිදු කරනු ලැබේ.

**IV. ගිණුම් ශාඛාව**

“නිවැරදි වූත් විනිවිද වූත් ඵලදායි මූල්‍ය කළමණාකරණයෙන් ආයතනික අභිවෘද්ධිය” යන ආංශික දැක්ම මුල් කර ගනිමින්, ආදායම් වියදම් පිළිබඳ සියළු කටයුතු ගිණුම්ගත කිරීම සහ මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම, විගණන විමසුම් හා රාජ්‍ය ගිණුම් කාරක සභාවට සැපයිය යුතු වාර්තා නිසි පරිදි සැපයීම, මුදල් රෙගුලාසි 135 යටතේ බලතල පැවරීමට අදාළ කටයුතු සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින් දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා සහාය වීම ගිණුම් අංශයේ කාර්යභාරය වේ.

**V. පරිගණක හා තොරතුරු තාක්ෂණ ශාඛාව**

දෙපාර්තමේන්තු දැක්ම හා මෙහෙවර උදෙසා අවශ්‍ය වන නවීන තාක්‍ෂණික ක්‍රම හඳුන්වා දෙමින් පරිගණක ගත තාක්ෂණික කටයුතු කළමණාකරණය කිරීම සහ දෙපාර්තමේන්තුව වෙත තාක්ෂණික සේවා සපයනු ලබන අනෙකුත් බාහිර ආයතන සම්බන්ධීකරණය කිරීමත් සියළු අංශ සඳහා අදාළ තාක්‍ෂණික සේවා සැපයීමත් ප්‍රධාන කාර්යභාරය වන අතර, අවශ්‍ය අවස්ථාවන්හි දී තොරතුරු නිකුත් කිරීම ද මෙම අංශයෙන් සිදු කරනු ලබයි.

**VI. අභ්‍යන්තර විගණන හා විමර්ශන ශාඛාව**

“විගණන හා විමර්ශන කටයුතු තුළින් ඉහළ ඵලදායිතාව” යන ආංශික දැක්ම ඔස්සේ දෙපාර්තමේන්තුවට සියළුම ශාඛා කාර්යාල වල අභ්‍යන්තර විගණන කටයුතු හා විමර්ශනය සිදු කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ කටයුතු නිවැරදි ගමන් මඟක ගෙන යාම සඳහා සහාය වීමත් මෙම අංශයේ කාර්යභාරය වේ.

**VII. නීති ශාඛාව**

“සාධාරණත්වය නීතියට ඉදිරියෙන්” යන ආංශික දැක්ම ඔස්සේ ක්‍රියාත්මක වෙමින් දෙපාර්තමේන්තුවේ ක්‍රියාවලිය පවත්වා ගෙන යාමට අවශ්‍ය නෛතික සංශෝධනයන් පනත් කෙටුම්පත් හරහා ගෙන ඒමත් නීතිමය කටයුතු සඳහා දායකත්වය ලබා දෙමින් දෙපාර්තමේන්තුවට එරෙහි නඩු පැවරීම් වලදී නීතිපති දෙපාර්තමේන්තුව හා අනෙකුත්

පාර්ශව සම්බන්ධීකරණය කරමින් ඒ වෙනුවෙන් පෙනී සිටීමත් සහ මෝටර් වාහන සම්බන්ධයෙන් වන නීතිමය තත්ත්වයන් සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම සිදු කරනු ලබයි.

**VIII. සුඛෝපභෝගී බදු ශාඛාව**

“විධිමත් බදු කරණය තුළින් ජාතික සංවර්ධනයට උර දීම” යන ආංශික දැක්ම මත ක්‍රියාත්මක වෙමින් 1995 අංක 16 දරන මුදල් පනත හා සංශෝධිත පනත් යටතේ සුඛෝපභෝගී, අර්ධ සුඛෝපභෝගී, අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්යය බදු අයකිරීම සිදුකරන රක්‍ෂණ ආයතන කළමනාකරණය කිරීම හා මඟ පෙන්වීම, බදු ගෙවීම පිළිබඳ වාහන හිමියන් දැනුවත් කිරීම සහ හිඟ බදු අයකිරීම, බදු ගෙවීම සම්බන්ධව ඒ, ඒ වාහන වෙනුවෙන් පරිගණක පද්ධතිය පවත්වාගෙන යාම, බදු ආදායම් මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම හා ආදායම් වාර්තා සකස් කිරීම මෙම අංශයේ කාර්යභාරය වේ.

**IX. වෙළඳ වාහන නව ලියාපදිංචි ශාඛාව I හා II**

“වෙළඳ වාහන නව ලියාපදිංචි කිරීම තුළින් මෝටර් වාහන නියාමනයෙන් ඉහළ මහජන ප්‍රසාදය” යන ආංශික දැක්ම ඔස්සේ ක්‍රියාත්මක වෙමින් විශේෂ කාර්යය වාහන, ද්විත්ව කාර්යය වාහන, මෝටර් ලොරි, මෝටර් කාර් හා ත්‍රිවිධ හමුදා මගින් මිලදී ගන්නා, රාජසන්තක කර වෙන්දේසි කරන ලද වාහන ලියාපදිංචි කර ලියාපදිංචි සහතික නිකුත් කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරයයි. ඊට අමතරව රජයේ ප්‍රතිපත්ති අනුව වාහන සඳහා ඉදිරි අංක වෙන් කිරීම හා ඒ සඳහා ගාස්තු අයකිරීම සිදුකරනු ලබයි. වසර 2020 දී මෙම අංශය මගින් මෝටර් වාහන 43,374 ක ලියාපදිංචි කටයුතු සිදුකර ඇත.

**X. ත්‍රී රෝද රථ නව ලියාපදිංචි ශාඛාව**

"ත්‍රී රෝද රථ නව ලියාපදිංචි කිරීම තුළින් මානව හිතවාදී නීති ගරුක සමාජයක්" යන ආංශික දැක්ම ඔස්සේ ක්‍රියාත්මක වෙමින් මෙතෙක් ලියාපදිංචි නොවූ ත්‍රී රෝද රථ පළමු වරට ලියාපදිංචි කිරීම සිදු කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරයයි. ඊට අමතරව තානාපති කාර්යාලයන්හි වාහන පැවරීම ලියාපදිංචිය, එම වාහන වල ලියාපදිංචිය අවලංගු කිරීම සහ එම වාහන රටින් බැහැර ගෙන යාමට අදාළ කාර්යයන් ඉටුකරනු ලැබේ. 2020 වර්ෂය තුළ ත්‍රී රෝද 7,150 ක් මෙම අංශය මගින් ලියාපදිංචි කර ඇත.

**XI. යතුරුපැදි නව ලියාපදිංචි ශාඛාව**

"මහජනතාව වෙත කාල පමාවකින් තොරව විශිෂ්ඨ සේවාවක් සැපයීම" යන ආංශික දැක්ම ඔස්සේ ක්‍රියාත්මක වෙමින් ශ්‍රී ලංකාව තුළ මෙතෙක් ලියාපදිංචි නොකළ නව යතුරුපැදි ලියාපදිංචි කිරීම හා ඊට අදාළ සියළු කාර්යයන් ඉටු කිරීම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. 2020 වසර තුළ 151,634ක අගයකින් යුත් යතුරුපැදි සංඛ්‍යාවක් ලියාපදිංචි කර ඇත.

## XII. වාහන අයිතිය පැවරීමේ ශාඛා

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තුළ මූලික ලියාපදිංචිය සිදුකර ඇති සියළුම වාහන වල අයිතිය නැවත පැවරීම ලියාපදිංචි කිරීම මෙම ශාඛා තුළින් සිදු කරයි. මෙම වාහන පැවරීමේ කාර්යය සඳහා ඒ, ඒ වාහන වර්ගය අනුව පැවරුම් අංශ හයක් දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කර ඇත. එනම්,

- ❖ ලොරි පැවරුම් අංශය
- ❖ කාර් පැවරුම් අංශය
- ❖ වෙළඳ වාහන පැවරුම් අංශය
- ❖ ත්‍රිරෝද රථ පැවරුම් අංශය
- ❖ යතුරුපැදි පැවරුම් අංශය
- ❖ බස් හා ඉඩම් වාහන පැවරුම් අංශය

මෙම සෑම අංශයක්ම කොමසාරිස්වරයකුගේ හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකුගේ හෝ සහකාර කොමසාරිස්වරයකුගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වන අතර, තම කාර්යයන් සාමාන්‍ය සේවා හා එක්දින සේවා පහසුකම් යටතේ සිදු කරනු ලබයි. මෙම සියළුම අංශයන්ගේ කාර්යභාරය පොදුවේ පහත පරිදි දැක්විය හැක.

- * පැවරීම ලියාපදිංචි කිරීම.
- * පරම අයිතිය හෝ උකසක් සහිතව පැවරීම ලියාපදිංචි කිරීම.
- * පරම අයිතිය හෝ උකසක් අවලංගු කර පැවරීම ලියාපදිංචි කිරීම.
- * ලියාපදිංචි සහතිකයේ අනු පිටපත් නිකුත් කිරීම.
- * විධිමත් අයුරෙන් සිදු කරන භෞතික වෙනස්කම් මෙන්ම ලේඛනමය වෙනස්කම් ද ලියාපදිංචි සහතිකයේ ඇතුළත් කිරීම.
  උදා :- එංජින් අංකය, වර්ණය, ලිපිනය
- * නව ඉංග්‍රීසි අක්ෂර සහිත වාහන වල අංක තහඩු හා ස්ටිකර් වල අනු පිටපත් නිකුත් කිරීම සඳහා දත්ත පරිගණක ගත කිරීම.
- * පැවරීමක් සඳහා පැවරුම් ශාඛාවට අයදුම්පත් ඉදිරිපත් කර ඇති වාහන සඳහා ආදායම් බලපත්‍රය ලබා ගැනීමට අවශ්‍ය MTA-11 ලේඛන සනාථ කර නිකුත් කිරීම.
- * නෛතික කටයුතු සඳහා අවශ්‍ය වන සහතික කරන ලද පරිගණක උධෘත නිකුත් කිරීම හා ලැබෙන විරෝධතා සටහන් කර ගැනීම.

## XIII. කාර්මික ශාඛාව

වාහන ලියාපදිංචි කිරීමට අදාළව සපයනු ලබන කාර්මික සේවාවන් වන වාහන පරීක්ෂා කිරීම, බර සහතික නිකුත් කිරීම හා අනෙකුත් කාර්මික සේවාවන් සැපයීම මෙන්ම ඒ සම්බන්ධ අවශ්‍ය උපදෙස් ලබා දීම කාර්මික ශාඛාව මඟින් සිදුකරනු ලැබේ. මෙම අංශය සහකාර කොමසාරිස් (කාර්මික) යටතේ ක්‍රියාත්මක වන අතර, මෝටර් රථ පරීක්ෂකවරුන්ගේ අධීක්ෂණ කටයුතු පවත්වා ගෙන යමින් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වෙත සහාය වීමද මෙම අංශයේ කාර්යභාරයන් අතර වේ.

**වේරහැර උප කාර්යාලය**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයට අනුබද්ධව ක්‍රියාත්මක වන වේරහැර උප කාර්යාලය තුළින් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වන රියදුරු බලපත්‍ර නිකුත් කිරීමට අදාළ සියළු කාර්යයන් හා වාහන පරීක්ෂාව, බර සහතික නිකුත් කිරීම, රියදුරු පාසල් නියාමනයට අදාළ කටයුතු සිදුකරනු ලබයි. මෙම කාර්යාලයේ සියළු කටයුතු කොමසාරිස්වරයෙකු සහ නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරයකු මගින් පාලනය වේ.


**දිස්ත්‍රික් කාර්යාල**

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය දීප ව්‍යාප්ත කරමින්, සේවාලාභීන්ට තම දිස්ත්‍රික්කය තුළදීම උපරිම සේවයක් ලබාදීමේ අරමුණින්, සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දිස්ත්‍රික් කාර්යාල පිහිටුවා ඇත. සියළු දිස්ත්‍රික් කාර්යාල දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ අධීක්ෂණය යටතේ පවත්වා ගෙන යන අතර, ඒ අතරින් යාපනය කාර්යාලය නියෝජ්‍ය කොමසාරිස්වරයකු යටතේ හා හම්බන්තොට, අනුරාධපුරය, ගම්පහ හා කුරුණෑගල කාර්යාල සහකාර කොමසාරිස්වරුන් යටතේ ක්‍රියාත්මක වේ. සියළු දිස්ත්‍රික් කාර්යාලවලට ප්‍රධාන මෝටර් රථ පරීක්ෂකවරයෙක් හා මෝටර් රථ පරීක්ෂකවරුන් අනුයුක්ත කර ඇත.

මෙම දිස්ත්‍රික් කාර්යාල මගින් මූලික වශයෙන් රියදුරු බලපත්‍ර සඳහා අයදුම්පත් භාර ගැනීම, බලපත්‍ර නිකුත් කිරීමට අදාළ ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීමද සිදු කරනු ලබයි. මේ යටතේ අනුරාධපුරය හා හම්බන්තොට යන දිස්ත්‍රික් කාර්යාල මගින් රියදුරු බලපත් මුද්‍රණය කර නිකුත් කිරීම සිදු කරනු ලබයි. මාර්ගගත ක්‍රමය (online) යටතේ රියදුරු බලපත්‍ර සම්බන්ධ කටයුතු කුරුණෑගල, ගම්පහ, කළුතර, මොනරාගල, මහනුවර සහ යාපනය යන දිස්ත්‍රික් කාර්යාල මගින් සිදු කළද එහිදී සිදු කරනුයේ රියදුරු බලපත් නිකුත් කිරීම සඳහා අයදුම්පත් භාර ගැනීමට අදාළ කටයුතු පමණි. ඒ සඳහා වන රියදුරු බලපත් නිකුත් කරනු ලබන්නේ වේරහැර කාර්යාලය මගිනි. අනෙකුත් දිස්ත්‍රික් කාර්යාල රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේදී මාර්ග අපගත ක්‍රමය (off line) භාවිතා කරයි.

මෙම කාර්යයන්ට අමතරව වෙන් කරන ලද අංක මත දිස්ත්‍රික්කයට අදාළ යතුරුපැදි නව ලියාපදිංචි කිරීම, දිස්ත්‍රික්කය තුළ එම යතුරුපැදි පැවරීම ලියාපදිංචි කිරීම, බර සහතික නිකුත් කිරීම හා කාර්මික සේවාවන්ට අදාළ කටයුතු ද දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කිරීම සඳහා පැවරුම් වලට අදාළ සියළු කටයුතු වෙනුවෙන් අයදුම්පත් භාර ගැනීම ද දිස්ත්‍රික් කාර්යාල මගින් සිදුකරනු ලබයි.

**දිස්ත්‍රික් කාර්යාලීය ව්‍යාප්තිය**




1.1 දිස්ත්‍රික් කාර්යාල වල පිහිටීම

# 02 පරිච්ඡේදය

## දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය

## 2.1 ධාවනය කළ හැකි මෝටර් වාහන නව ලියාපදිංචිය

මෙරටට ආනයනය කරන ලද හෝ මෙරට නිෂ්පාදනය කරන ලද හෝ එකලස් කරන ලද වාහන ශ්‍රී ලංකාව තුළ ප්‍රථමවරට ලියාපදිංචි කිරීම මෙම කාර්යය යටතේ සිදු කරනු ලබයි. මෙම ලියාපදිංචි කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 04 මගින් සිදු කරනු ලබයි.

එනම්,

1. යතුරුපැදි නව ලියාපදිංචි ශාඛාව
2. ත්‍රීරෝද රථ නව ලියාපදිංචි ශාඛාව
3. වෙළඳ වාහන නව ලියාපදිංචි ශාඛාව I (කාර්, ලොරි, ද්විත්ව කාර්යය වාහන, සිංගල් කැබ්, ප්‍රයිම්මුවර්, අවමංගල්‍ය රථ සහ ගිලන් රථ)
4. වෙළඳ වාහන නව ලියාපදිංචි ශාඛාව II (බස් රථ , ට්‍රැක්ටර්)

මෙම වාහන වල පළමු ලියාපදිංචි සහතිකය නිකුත් කිරීමේ දී අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලිපි ලේඛන වල නිරවද්‍යතාව තහවුරු කර ගැනීමෙන් අනතුරුව ලියාපදිංචි ගාස්තු ගෙවීමෙන් පසු එක් දිනකින් ලියාපදිංචි කටයුතු අවසන් කර අදාළ ලියාපදිංචි සහතිකය නිකුත් කරනු ලබයි.

2020 වර්ෂය තුළ ලියාපදිංචි නව මෝටර් වාහන ප්‍රමාණය 202,628 ක් වන අතර ඒ අනුව මුළු මෝටර් වාහන ගහනය 8,297,852 ක් වේ. ලියාපදිංචි නව වාහන ප්‍රමාණය වසර 2019 ට සාපේක්ෂව 44.83% ක අඩු වීමකි. එම සංඛ්‍යාත්මක අගයන් පහත ලෙස සාරාංශ කළ හැක.


**2.1.1 වගුව :- වාහන ගහනය**

| වර්ෂය | ප්‍රමාණය | මුළු වාහන ගහනය |
|---|---|---|
| 2011 | 525,421 | 4,479,732 |
| 2012 | 397,295 | 4,877,027 |
| 2013 | 326,651 | 5,203,678 |
| 2014 | 429,556 | 5,633,234 |
| 2015 | 668,907 | 6,302,141 |
| 2016 | 493,328 | 6,795,469 |
| 2017 | 451,653 | 7,247,122 |
| 2018 | 480,799 | 7,727,921 |
| 2019 | 367,303 | 8,095,224 |
| 2020 | 202,628 | 8,297,852 |

**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

2020 වර්ෂයේ නව ලියාපදිංචි වූ වාහන සංඛ්‍යාව පහත ප්‍රස්ථාරයෙන් දැක්වේ.


**2.1.1 රූපසටහන**




**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකාවේ වාහන නව ලියාපදිංචිය සලකා බැලීමේදී 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ අඩු වීමක් සිදු වී ඇත.

**2.1.2 රූපසටහන**




**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**


**2.1.2** වගුව :- නව ලියාපදිංචි වාහන කාණ්ඩ

| වාහන පන්තිය | 2019.12.31 දිනට වාහන | 2020.12.31 දිනට වාහන | වැඩිවීම/අඩුවීම ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| මෝටර් කාර් | 38,232 | 21,021 | -45.02 |
| ත්‍රීරෝද රථ | 15,490 | 7,150 | -53.84 |
| මෝටර් සයිකල් | 284,301 | 151,634 | -46.66 |
| මෝටර් බස් | 1,613 | 578 | -64.17 |
| ද්විත්ව කාර්යය වාහන | 13,459 | 9,532 | -29.18 |
| මෝටර් ලොරි | 5,223 | 3,941 | -24.55 |
| ඉඩම් වාහන ට්‍රැක්ටර් | 5,696 | 6,025 | 5.78 |
| ඉඩම් වාහන (ට්‍රේලර්) | 1,970 | 2,277 | 15.58 |
| ක්‍රොඩ් සයිකල් | 1,318 | 470 | -64.34 |
| මෝටර් නිවාස | 1 | - | -100.00 |
| එකතුව | **367,303** | **202,628** | **-44.83** |

මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

**2020** වසරේ ලියාපදිංචි වූ නව වාහන කාණ්ඩ

**2.1.3** රූපසටහන




මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව


2019 වර්ෂයට සාපේක්ෂව වාහන ලියාපදිංචිය සලකා බැලීමේදී බොහෝ වාහන කාණ්ඩවල ලියාපදිංචියේ සංඛ්‍යාත්මක අගයන්හි පහළ යාමක් දැකිය හැකිය. වාහන ආනයනය සම්බන්ධව රජයේ ප්‍රතිපත්තිය මෙන්ම කල්බදු ලබා දීමේ ප්‍රතිශතයන් සීමා කිරීම ඇතුළු සාධක මේ කෙරෙහි බලපා ඇත. ඉහත වාහන ලියාපදිංචියේ සංඛ්‍යාත්මක අගයන් සලකා බැලීමේදී මෝටර් කාර්, ත්‍රීරෝද රථ හා යතුරු පැදි ලියාපදිංචිය තුළින් ලංකාව තුළ ඉහළ යන වාහන ගහණය සඳහා ඉහළ දායකත්වයක් ලබා දෙන බව පෙන්වා දිය හැක. එම වාහන කාණ්ඩ 3හි ලියාපදිංචිය පහත සඳහන් පරිදි වෙන් වෙන් වශයෙන් දැක්විය හැකිය.

**2020 වර්ෂයේ මෝටර් කාර් නව ලියාපදිංචිය**

**2.1.3 වගුව :- නව ලියාපදිංචි මෝටර් කාර් දත්ත**

| මාසය | වාහන ප්‍රමාණය |
|---|---|
| ජනවාරි | 3,753 |
| පෙබරවාරි | 3,139 |
| මාර්තු | 1,710 |
| අප්‍රේල් | - |
| මැයි | 2,929 |
| ජුනි | 3,177 |
| ජූලි | 2,688 |
| අගෝස්තු | 1,611 |
| සැප්තැම්බර් | 1,041 |
| ඔක්තෝබර් | 279 |
| නොවැම්බර් | 254 |
| දෙසැම්බර් | 440 |

**2.1.4 රූපසටහන**





මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

**2.1.4 වගුව : - නව ලියාපදිංචි මෝටර් කාර් දත්ත (2011 – 2020)**

| වර්ෂය | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ලියාපදිංචි වූ මෝටර් කාර් සංඛ්‍යාව | 57,886 | 31,546 | 28,380 | 38,780 | 105,628 | 45,172 | 39,182 | 80,776 | 38,232 | 21,021 |

මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

**2.1.5 රූපසටහන**





මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

## 2020 වර්ෂයේ යතුරු පැදි නව ලියාපදිංචිය

### 2.1.5 වගුව :- නව ලියාපදිංචි යතුරු පැදි දත්ත

| මාසය | වාහන ප්‍රමාණය |
|---|---|
| ජනවාරි | 26,903 |
| පෙබරවාරි | 24,375 |
| මාර්තු | 9,908 |
| අප්‍රේල් | - |
| මැයි | 11,942 |
| ජුනි | 25,382 |
| ජූලි | 22,725 |
| අගෝස්තු | 14,035 |
| සැප්තැම්බර් | 9,129 |
| ඔක්තෝබර් | 3,137 |
| නොවැම්බර් | 1,856 |
| දෙසැම්බර් | 2,242 |

### 2.1.6 රූපසටහන





මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

### 2.1.6 වගුව :- නව ලියාපදිංචි යතුරු පැදි දත්ත (2011 – 2020)

| වර්ෂය | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ලි.ප. යතුරුපැදි සංඛ්‍යාව | 253,33 | 192,284 | 169,280 | 272,885 | 370,889 | 340,129 | 344,380 | 339,763 | 284,301 | 151,634 |

මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

### 2.1.7 රූපසටහන





මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

## 2020 ත්‍රීරෝද රථ නව ලියාපදිංචිය

### 2.1.7 වගුව :- නව ලියාපදිංචි ත්‍රීරෝද රථ

| මාසය | වාහන ප්‍රමාණය |
|---|---|
| ජනවාරි | 1,687 |
| පෙබරවාරි | 1,539 |
| මාර්තු | 786 |
| අප්‍රේල් | - |
| මැයි | 812 |
| ජුනි | 1,152 |
| ජූලි | 698 |
| අගෝස්තු | 234 |
| සැප්තැම්බර් | 132 |
| ඔක්තෝබර් | 57 |
| නොවැම්බර් | 29 |
| දෙසැම්බර් | 24 |

### 2.1.8 රූපසටහන





මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

### 2.1.8 වගුව :- නව ලියාපදිංචි ත්‍රීරෝද රථ (2011 – 2020)

| වර්ෂය | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ලි.ප. ත්‍රීරෝද රථසංඛ්‍යාව | 138,426 | 98,815 | 83,673 | 79,038 | 129,547 | 56,945 | 23,537 | 20,063 | 15,490 | 7,150 |

මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

### 2.1.9 රූපසටහන





මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

අලුතින් ලියාපදිංචි වන මෙම වාහන භාවිතා කරනු ලබන ඉන්ධන වර්ගය අනුව ප්‍රධාන වශයෙන් කාණ්ඩ 03 ක් යටතේ වර්ග කළ හැක. එනම්,

- ✓ පෙට්‍රල් භාවිතා කරන වාහන
- ✓ ඩීසල් භාවිතා කරන වාහන
- ✓ වෙනත්
  - පෙට්‍රල් / ඉලෙක්ට්‍රිකල් වාහන
  - ඩීසල් / ඉලෙක්ට්‍රිකල් වාහන
  - ඉලෙක්ට්‍රික් වාහන
  - ඉන්ධන භාවිතා නොකරන වාහන

**2.1.10 රූපසටහන**





**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

2020 වර්ෂය තුළ පෙට්‍රල් භාවිතයෙන් ධාවනය වන වාහන 182,441 ක් ද ඩීසල් භාවිතයෙන් ධාවනය වන වාහන 15,768 ක් ද ලියාපදිංචි වී ඇති අතර ඉන්ධන භාවිතයක් රහිත වාහන 2,414 ක් ද ලියාපදිංචි වී ඇත. පෙට්‍රල් භාවිතයෙන් ධාවනය වන වාහන ප්‍රමාණය ලියාපදිංචි වූ මුළු වාහන ප්‍රමාණයෙන් 90% කි.

## 2.2 වාහන හිමිකම් පැවරීම ලියාපදිංචි කිරීම

ලියාපදිංචි කළ වාහන නැවත පැවරීම ලියාපදිංචි කිරීම සලකා බැලීමේදී 2020 වර්ෂයේදී සිදු කළ පැවරුම් සංඛ්‍යාව 552,628 කි. වාහන පැවරුම් වල සිදු වූ වර්ධනයේ ප්‍රවණතාවය පහත රූප සටහන තුළින් දැක්විය හැක. හිමිකම් පැවරීමේ ක්‍රියාවලිය රට තුළ මහජනයා අතර වාහනවල අයිතිය සංසරණය වීමේ ස්වභාවය පෙන්නුම් කරයි. සෑම වර්ෂයකම යම් ඉහළ යාමක් පෙන්නුම් කිරීම මෙහි කැපී පෙනෙන ලක්ෂණයකි.

### 2.2.1 රූපසටහන




මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

ඉහත රූප සටහන අනුව 2019 වසරේදී සිදු කරන ලද 675,018 පැවරුම් සංඛ්‍යාවට සාපේක්ෂව 2020 වර්ෂයේදී සිදු කළ පැවරුම් සංඛ්‍යාව 552,628 කි.


2020 වසරේ පැවරුම් ප්‍රමාණය ඒ ඒ වාහන කාණ්ඩ අනුව පහත පරිදි වෙන් කර දැක්විය හැක.

### 2.2.1 වගුව :- වාහන පැවරුම් සංයුතිය

| වාහන වර්ගය | 2019 | 2020 |
|---|---|---|
| කාර් පැවරුම් | 136,618 | 118,012 |
| ත්‍රීරෝද රථ/ත්‍රීවිලර් වෑන්/ ත්‍රීවිලර් කාර් පැවරුම් | 221,006 | 155,654 |
| යතුරු පැදි පැවරුම් | 163,399 | 137,390 |
| වෙළඳ වාහන පැවරුම් | 84,582 | 63,665 |
| ලොරි පැවරුම් | 45,374 | 31,771 |
| බස් පැවරුම් | 14,246 | 8,088 |
| ඉඩම් වාහන පැවරුම් | 9,792 | 8,048 |
| මෝටර් නිවාස | 1 | - |
| එකතුව | 675,018 | 522,628 |

මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

### 2.2.2 රූපසටහන



## 2.3 රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ සේවාව

රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාපිළිවෙල හා එහි ස්වභාවය දෙපාර්තමේන්තුව ආරම්භයේ සිට අවස්ථා ගණනකදී විකාශනය වෙමින් වර්තමානයේ නිකුත් කරනු ලබන ජාත්‍යන්තර ප්‍රමිතියකින් යුතු නව ස්මාර්ට් කාඩ් රියදුරු බලපත්‍රය දක්වා විකාශනය වී ඇත. මෙම ස්මාර්ට් කාඩ් රියදුරු බලපත්‍රය ව්‍යාජ ලෙස මුද්‍රණය කිරීම වැළැක්වීම සඳහා උසස් තත්ත්වයේ ආරක්ෂණ උපක්‍රම භාවිතා කර ඇති අතර, මෙහි බලපත්‍ර දරන්නාගේ රුධිර ගණයද ඇතුළත් කර ඇත. වේරහැර උපකාර්යාලය කේන්ද්‍ර කර ගනිමින් අනෙකුත් දිස්ත්‍රික් කාර්යාල හරහා රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය ආකාර දෙකක් මගින් සිදු කරනු ලබයි.

එනම්,

1. On line (මාර්ග ගත සම්බන්ධතාවය)
   මෙම ක්‍රමය යටතේ රියදුරු බලපත්‍රයක් ලබා ගැනීමට පැමිණෙන සේවාලාභියාගේ මූලික තොරතුරු පරිගණක ගත කර එම වැඩසටහන හරහාම ඡායාරූප ලබා ගැනීම, ඇඟිලි සලකුණු හා අත්සන් ලබා ගැනිමත් ඊට අදාළ මූලික ලේඛන පරිලෝකනය (SCAN) කර දත්ත පද්ධතියට තොරතුරු තහවුරු කිරීමෙන් පසු රියදුරු බලපත්‍රය නිකුත් කිරීමත් මේ යටතේ සිදු වේ. මීට අමතරව ලිඛිත පරීක්ෂණ සිදු කර එම අවස්ථාවේම දත්ත පද්ධතියට තොරතුරු ඇතුළත් කිරීමත් රියදුරු බලපත්‍රයේ උද්ධෘතයන් ඉල්ලුම් කරන අවස්ථාවකදී අවස්ථෝචිතව නිකුත් කිරීමත් සිදු කරනු ලබයි. මේ සඳහා වේරහැර කාර්යාලය කේන්ද්‍ර කර ගනිමින් හම්බන්තොට, අනුරාධපුර, ගම්පහ, කළුතර, කුරුණෑගල, මොනරාගල, යාපනය හා මහනුවර යන දිස්ත්‍රික් කාර්යාල වල ක්‍රියාත්මකවේ.

2. Off Line ( මාර්ගගත නොවන සම්බන්ධතාවය)
   අනෙකුත් දිස්ත්‍රික් කාර්යාල රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ දී ලිඛිත පරීක්ෂණ සිදු කිරීම, ආකෘති පත්‍ර හරහා අයදුම්පත් හා ලිපි ලේඛන ලබා ගැනීමෙන් අනතුරුව එම තොරතුරු තහවුරු කර වේරහැර කාර්යාලය වෙත යොමු කර රියදුරු බලපත්‍ර නිකුත් කිරීම සිදු කරනු ලබයි. මෙහිදී සේවාලාභියා වෙත තාවකාලික රියදුරු බලපත්‍රයක් දිස්ත්‍රික් කාර්යාලය හරහා නිකුත් කිරීම සිදු කෙරේ.

**2.3.1 වගුව :- රියදුරු බලපත් නිකුත් කිරීම 2020**

| මාසය | 2020.12.31 දිනට නිකුත් කල බලපත්‍ර ප්‍රමාණය |
|---|---|
| ජනවාරි | 72,111 |
| පෙබරවාරි | 82,290 |
| මාර්තු | 35,209 |
| අප්‍රේල් | 12,685 |
| මැයි | 50,251 |
| ජූනි | 77,500 |
| ජූලි | 89,016 |
| අගෝස්තු | 73,711 |
| සැප්තැම්බර් | 78,163 |
| ඔක්තොම්බර් | 53,610 |
| නොවැම්බර් | 29,082 |
| දෙසැම්බර් | 55,281 |
| එකතුව | 708,909 |

| වර්ගය | 2020.12.31 දිනට නිකුත් කල බලපත්‍ර ප්‍රමාණය |
|---|---|
| සංශෝධන | 29,632 |
| පරිවර්තන | 22,675 |
| අනුපිටපත් | 35,700 |
| වාහන පංති එකතු කිරීම | 50,866 |
| නව රියදුරු බලපත්‍ර | 251,231 |
| අලුත් කිරිම් | 317,684 |
| විදේශ රියදුරු බලපත්‍ර පරිවර්තන | 1,121 |
| එකතුව | 708,909 |

මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

2020 දෙසැම්බර් 31 දින දක්වා නිකුත් කර ඇති මුළු රියදුරු බලපත් සංඛ්‍යාව 708,909 ක් වේ. වේරහැර කාර්යාලයේ රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීමට අමතරව හම්බන්තොට හා අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාල සඳහා රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීමේ යන්ත්‍ර ස්ථාපනය කර ඇත.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තොරතුරු තාක්ෂණයේ ඉදිරි පියවරක් තබමින් රියදුරු බලපත්‍ර ලිඛිත විභාගය පරිගණක ආශ්‍රයෙන් (Touch Screen) ක්‍රියාත්මක කිරීම වේරහැර කාර්යාලයේ සිදු කරන අතර ඉදිරියේදී මෙම ක්‍රමය අනෙකුත් දිස්ත්‍රික් කාර්යාල වෙතද ලබා දීමට බලාපොරොත්තු වේ.

## 2.4 මෝටර් වාහන සම්බන්ධ කාර්මික සේවාව

කාර්මික සේවාව සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලයෙන් වේරහැර උප කාර්යාලයෙන් හා සියළුම දිස්ත්‍රික් කාර්යාල වලින් සිදු කරන කාර්යයන් පොදුවේ පහත ලෙස දැක්විය හැක.

- රියදුරු බලපත්‍ර සම්බන්ධ ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම.
- වාහන පරීක්ෂාකර බර සහතික නිකුත් කිරීම, අනන්‍යතා සහතික නිකුත් කිරීම.
- රජයේ වාහන සඳහා යෝග්‍යතා සහතික නිකුත් කිරීම.
- වාහන සම්බන්ධ ටෙන්ඩර් මණ්ඩල සඳහා සහභාගී වීම, වාහන ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා නිර්දේශ ලබා දීම.
- කාර්මික ගරාජ ලියාපදිංචි කිරීම් සහ වාර්ෂික බලපත්‍ර අලුත් කිරීම.

- CMT වැසි අංක, ට්‍රේලර වැසි අංක නිකුත් කිරීම.
- රියදුරු උපදේශක පාඨමාලා සහ කාර්මික අංශයට අදාළ පුහුණු පාඨමාලා සකස් කර ක්‍රියාත්මක කිරීම.
- බරපතල අනතුරු සම්බන්ධ වාහන පරීක්ෂා කර, නිරීක්ෂණ අධිකරණය වෙත වාර්තා කිරීම.

ප්‍රධාන කාර්යාලය ඇතුළු අනිකුත් කාර්යාල වලින් සිදුකරනු ලබන කාර්මික සේවාවන් ප්‍රධාන කාණ්ඩ දහනවයක් (19) යටතේ වර්ග කර දැක්විය හැකි අතර, එම එක් එක් කාණ්ඩයන්ට අදාළ සංඛ්‍යාත්මක දත්ත පහත 2.4.1 වගුව මගින් සාරාංශ කර පහත පරිදි දැක්විය හැක

**2.4.1 වගුව :- කාර්මික සේවාවන්**

| | කාර්යය | 2019 | 2020 |
|---|---|---|---|
| 1 | රියදුරු බලපත්‍ර ලබා ගැනීමේ ලිඛිත පරීක්ෂණ පැවැත්වීම | 204,398 | 230,585 |
| 2 | රියදුරු බලපත්‍ර ලබා ගැනීමේ ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම | 392,181 | 475,709 |
| 3 | අංක තහඩු නිකුත් කිරීම (කොළඹ) | 597,633 | 50,553 |
| 4 | අංක තහඩු නිකුත් කිරීම (පිට පළාත්) | 107,057 | 184,814 |
| 5 | ගරාජ, නව වෙළඳ ආයතන පරීක්ෂා කිරීම | 53 | 36 |
| 6 | ගරාජ, නව වෙළඳ ආයතන ලියාපදිංචි කිරීම | 72 | 31 |
| 7 | ගරාජ, නව වෙළඳ ආයතන අලුත් කිරීම | 937 | 715 |
| 8 | රියදුරු පාසල් පරීක්ෂා කිරීම | 576 | 334 |
| 9 | මූලාකෘති නිකුත් කිරීම | 112 | 76 |
| 10 | C.M.T. වැසි අංක නිකුත් කිරීම | 3 | 4 |
| 11 | ට්‍රේලර් වැසි අංක නිකුත් කිරීම | 1,434 | 1,229 |
| 12 | රේගු වෙන්දේසි වාහන සඳහා C.M.T. වැසි අංක නිකුත් කිරීම | 8 | - |
| 13 | යතුරුපැදි පරීක්ෂා කිරීම | 159 | 205 |
| 14 | බර සහතික නිකුත් කිරීම | 6,061 | 4,454 |
| 15 | අනන්‍යතා සහතික නිකුත් කිරීම | 855 | 666 |
| 16 | තහනම් නියෝග නිකුත් කිරීම | 1,377 | 640 |
| 17 | තහනම් නියෝග ඉවත් කිරිම | 1,364 | 500 |
| 18 | රිය අනතුරු පරීක්ෂා කිරීම | 3,848 | 3,241 |
| 19 | විශේෂ රාජකාරී සඳහා සහභාගී වීම | 305 | 315 |

## 2.5 වායු විමෝචන තත්ත්වය නියාමනය

ප්‍රමිතියෙන් තොර වාහන භාවිතය නිසා සිදු වන පරිසර දූෂණය වළක්වමින් ඒ සඳහා දායකවන වාහන වලින් පිටවන දුම පාලනය කිරීමේ පරමාර්ථයෙන් 2008 ජනවාරි මස 25 වන දින නිකුත් කරන ලද අංක 1533/17 දරණ අතිවිශේෂ ගැසට් නියෝගයත්, 2009 අංක 08 මෝටර් වාහන (සංශෝධන) පනත හා අංක 1557/14 ජාතික පරිසර (වායු විමෝචන ඉන්ධන හා වාහන ආනයන ප්‍රමිති) අති විශේෂ ගැසට් පත්‍රය අනුව 2008 නොවැම්බර් මස 17 දින සිට ක්‍රියාත්මක වන පරිදි වායු විමෝචන පරීක්ෂණ කටයුතු ආරම්භ කරන ලදී. එසේම නව ප්‍රමිතීන් 2014.11.05 දින ප්‍රකාශයට පත් කර ඇති අතර එම ප්‍රමිතීන් 2016 සැප්තැම්බර් මස 15 වන දින සිට ක්‍රියාත්මක කර ඇති අතර පුවත්පත් දැන්වීම් හා ප්‍රජා දැනුවත් කිරීම් සිදු කරන ලදී.

අප අවට වායු ගෝලයේ ගුණාත්මක භාවය මැනීම සඳහා වාහන වායු විමෝචන භාරකාර අරමුදල මඟින් සංසරණ වායු තත්ත්වය මැනීමේ ඒකක 03ක් මිලදී ගෙන ඇත. ස්ථිර ඒකක 02ක් මහනුවර නගරයේ හා බත්තරමුල්ල නගරයේ ස්ථාපනය කර ඇති අතර, එමගින් දත්ත ලබා ගැනීමට හා නඩත්තු කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙත භාර දී ඇත. ජංගම ඒකකයේ දත්ත ලබා ගැනීම හා නඩත්තු කිරීම ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මඟින් සිදු කරනු ලබයි. මෙම ඒකක වලින් ලබා ගන්නා දත්ත වාහන වායු විමෝචන වැඩසටහනේ ප්‍රතිඵල අධ්‍යයනය කිරීම සඳහා භාවිතා කරනු ලබයි.



**ස්ථිර වායු තත්වය මැනීමේ ඒකකය**



**ජංගම ඒකකය**

එමෙන්ම වායු විමෝචන භාරකාර අරමුදලේ ප්‍රතිපාදන මඟින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය, ජාතික සෞඛ්‍ය විද්‍යා ආයතනය හා පේරාදෙණිය, මොරටුව විශ්වවිද්‍යාලයන්හි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් විසින් සිදු කරනු ලැබූ පර්යේෂණ වලින් ලබා දී ඇති දත්ත හා නිගමන ඉදිරි තත්ත්ව කළමනාකරණ වැඩ සටහන් සඳහා යොදා ගැනීමට කටයුතු සිදු කරනු ලබයි.

මාර්ගයේ ධාවනය වන වාහන පරීක්ෂා කිරීම සඳහා කණ්ඩායම් වශයෙන් මාර්ගස්ථ පරීක්ෂාවන් හා ස්ථානීය පරීක්ෂාවන් සිදු කරයි. එහිදී මාර්ගස්ථ පරීක්ෂාවන් 533 ක් හා ස්ථානීය පරීක්ෂාවන් 2,206 ක්

2020 වසරේ ජනවාරි සිට දෙසැම්බර් 31 දින දක්වා සිදු කර ඇත. එමෙන්ම ශ්‍රී ලංකා යුධ හමුදාවට හා ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් වාහන 1,079 ක් පරීක්ෂාවට ලක් කර ඇත.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වායු විමෝචන අංශයේ නියාමනය යටතේ පවතින දුම් පරීක්ෂණ කටයුතු සිදු කරනු ලබන ලාෆ් හා ක්ලීන්කෝ ආයතනවලට අයත් මධ්‍යස්ථාන 241 ක් මාර්ගගත ක්‍රමවේදය (On Line) ඔස්සේ පරීක්ෂා කර ඇත.




මධ්‍යස්ථාන නිරීක්ෂණය



මාර්ගස්ථ පරීක්ෂාව



ස්ථානීය පරීක්ෂාව

එමෙන්ම මහජනතාව දැනුවත් කිරීම සඳහා අත්පත්‍රිකා මුද්‍රණය කර බෙදා හැරීම හා පුවත්පත් දැන්වීම් පළ කිරීම සිදු කරන ලදී.






## 2.6 මාර්ග ආරක්ෂාව පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්ට අමතරව මාර්ග ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා බාහිර ආයතන සමඟ ඒකාබද්ධව විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව මේ වන විට ප්‍රධාන නියමු ව්‍යාපෘති කිහිපයක් පවත්වා ගෙන යනු ලබයි. එනම්,

- රථ වාහන පාලනය හා මාර්ග ආරක්ෂාව සඳහා කළමනාකරණ පාඨමාලා පැවැත්වීම.
- ධාවනයට නුසුදුසු වාහන සම්බන්ධව පරීක්ෂා කර එම වාහන මාර්ග වලින් ඉවත් කිරීම සම්බන්ධ කාර්යයන්හිදී සම්පත් දායකත්වය ලබාදීම.
- තහනම් නියෝග නිකුත් කිරීම.
- මාර්ග ආරක්ෂාව පිළිබඳව ජාතික සභාව මඟින් පවත්වනු ලබන පාඨමාලා මෙහෙයවීම හා සම්පත් දායකත්වය ලබාදීම.
- රියදුරු පාසල් අධීක්ෂණය කිරීම




**ධාවනයට නුසුදුසු වාහන සම්බන්ධව පරීක්ෂා කිරීම**

### ඉදිරි දැක්ම

- E – motoring ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා ඊට සමගාමීව හම්බන්තොට හා කොළඹ වරාය ආශ්‍රිතව කාර්යාල ස්ථාපිත කිරීම
- මේ දක්වා රියදුරු බලපත්‍ර ලබාදීම සම්බන්ධ මාර්ගගත සේවාව (On Line) නොමැති සියළුම දිස්ත්‍රික් කාර්යාල සඳහා මාර්ගගත පහසුකම (On Line) ලබාදීම
- සියළුම දිස්ත්‍රික් කාර්යාල සඳහා රියදුරු බලපත්‍ර ලිඛිත විභාගය පරිගණක ආශ්‍රයෙන් (Touch Screen) ක්‍රියාත්මක කිරීම
- දිස්ත්‍රික් කාර්යාල වල හඳුනාගත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

# 03 පරිච්ඡේදය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

**ඒසීඒ -එෆ්**

**2020.12.31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය**

| අයවැය (වර්තමාන වර්ෂය) | | සටහන | තත්‍ය රු. 2020 | | 2019 | |
|---|---|---|---|---|---|---|
| | **ආදායම් ලැබීම්** | | | | | |
| | | | | | | |
| | ආදායම් බදු | 1 | | | | ඒසීඒ - 1 |
| | දේශීය භාණ්ඩ හා සේවා බදු | 2 | 1,783,309,794.00 | | 3,598,674,964.00 | |
| | අන්තර් ජාතික වෙළඳාම මත බදු | 3 | | | | |
| | බදු නොවන ආදායම් සහ වෙනත් | 4 | 7,243,534,291.00 | | 10,303,007,093.00 | |
| | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **9,026,844,085.00** | | **13,901,682,057.00** | |
| | | | | | | |
| | **ආදායම් නොවන ලැබීම්** | | | | | |
| | | | | | | |
| | භාණ්ඩාගාර අග්‍රිම | | | | 14,359,970.00 | ඒසීඒ - 3 |
| | තැන්පතු | | 1,312,757,293.00 | | 1,946,451,261.00 | ඒසීඒ - 4 |
| | අත්තිකාරම් ගිණුම් | | 31,266,362.00 | | 35,985,794.00 | ඒසීඒ - 5/5(අ) |
| | වෙනත් ලැබීම් | | | | | |
| | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | 1,344,023,655.00 | | 1,996,797,025.00 | |
| | **මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ = (අ) + (ආ)** | | **10,370,867,740.00** | | 15,898,479,082.00 | |
| | | | | | | |
| | අඩු කළා වියදම | | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **පුනරාවර්තන වියදම්** | | | | |
| | වේතන, වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 516,854,357.00 | 479,304,309.00 | |
| | අනෙකුත් භාණ්ඩ හා සේවා සහනාධාර, සහනාධාර | 6 | 958,955,903.00 | 1,205,896,392.00 | ඒසීඒ - 2 (II) |
| | ප්‍රදාන සහ මාරු කිරීම් | 7 | | | |
| | පොළී ගෙවීම් | 8 | 7,434,482.00 | 7,293,287.00 | |
| | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | | | |
| | **මුළු පුනරාවර්තන වියදම් (ඇ)** | | **1,483,244,742.00** | 1,692,493,988.00 | |
| | | | | | |
| | **මූලධන වියදම්** | | | | |
| | මූලධන වත්කම් | | | | |
| | පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 10 | 13,939,237.00 | 10,188,425.00 | |
| | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 10,155,106.00 | 10,913,207.00 | ඒසීඒ - 2 (II) |
| | ප්‍රාග්ධන පැවරීම් | 12 | | | |
| | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | | | |
| | හැකියා වර්ධනය | 14 | 867,605.00 | 1,015,915.00 | |
| | වෙනත් මූලධන වියදම් | 15 | 825,917,271.00 | 1,579,354,586.00 | |
| | **මුළු මූලධන වියදම් (ඉ)** | | **850,879,219.00** | 1,601,472,133.00 | |
| | | | | | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | **1,325,126,193.00** | 1,944,812,661.00 | ඒසීඒ - 4 |
| | තැන්පතු ගෙවීම් | | 1,294,280,442.00 | 1,907,825,915.00 | ඒසීඒ - 5/5(ඇ) |
| | අත්තිකාරම් ගෙවීම් | | 30,845,751.00 | 36,986,746.00 | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ** | | **2,254,763,672.00** | 3,646,102,902.00 | |
| | **මුළු වියදම උ = (ඇ+ඉ+ඊ)** | | **3,659,250,154.00** | 8,884,881,684.00 | |
| | 2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඈ-උ) | | **6,711,617,586.00** | 7,013,597,398.00 | |
| | | | | | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

**ඒසීඒ - පී**

2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | තත්‍ය | |
|---|---|---|---|
| | | **2020** රු. | **2019** රු. |
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ - 6 | 2,362,461,314.00 | 2,323,971,920.00 |
| | | | |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ - 5/5(අ) | 129,664,225.00 | 130,267,131.00 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ - 3 | 59,763,672.00 | 1,102,904.00 |
| **මුළු වත්කම්** | | **2,551,889,211.00** | **2,455,341,955.00** |
| | | | |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | (134,415,003.00) | (115,335,847.00) |
| දේපළ, පිරියත හා උපකරණ | | 2,362,461,314.00 | 2,323,971,920.00 |
| සංචිතය | | | |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ - 5(ආ) | | |
| | | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ - 4 | 264,079,228.00 | 245,602,978.00 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ - 3 | 59,763,672.00 | 1,102,904.00 |
| **මුළු වගකීම්** | | **2,551,889,211.00** | **2,455,341,955.00** |

පිටු අංක 26 සිට 28 දැක්වෙන ඉහත ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 31 සිට 33 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ

ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම පොත් සමඟ සැසඳීම්කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟවන බවටත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2021/02/26

එස්. එම්. ඩී. එල්. කේ. ද අල්විස්
ලේකම්
වාහන නියාමනය, බස්රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා
මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය
දෙවන අදියර, 03 වන මහල ... බත්තරමුල්ල.

ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2021.02.24

සුමිත් සී.කේ. අලහකෝන්
මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්
මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
කොළඹ - 05.

ප්‍රධාන ගණකාධිකාරි
නම :
දිනය : 2021.02.24

යූ.ඩී.එන්.එස්. සිරිවර්ධන
ප්‍රධාන ගණකාධිකාරි
මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

(මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ 2020 - මූල්‍ය ප්‍රකාශන වර්තාවේ පිටු අංක 03 උපුටා ගන්නා ලදී.)

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය ඒසීඒ - සී

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

| | තත්‍ය | |
|---|---|---|
| | **2020**<br>රු. | **2019**<br>රු. |
| | | |
| <u>**මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | |
| මුළු බදු ලැබීම් | 130,174,723.00 | 147,134,924.00 |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | 10,303,007,093.00 |
| ලාභ | | |
| ආදායම් නොවන ලැබීම් | 4,401,465,516.00 | 14,359,970.00 |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | |
| අග්‍රිම ලැබීම් | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **4,531,640,239.00** | 10,464,501,987.00 |
| | | |
| <u>**අඩු කළා - මුදල් වැය කිරීම් :**</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 1,436,087,558.00 | 6,361,750,117.00 |

| | | |
|---|---|---|
| සහනාධාර සහ මාරු කිරීම් වියදම් | | |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | |
| භාණ්ඩාගාරයටපියවන ලද අග්‍රිම | 2,254,763,672.00 | 3,646,102,905.00 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **3,690,851,230.00** | 10,007,853,022.00 |
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ) = (අ) - (ආ)** | **840,789,009.00** | 456,648,962.00 |
| | | |
| **<u>ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| පොළී | | |
| ලාභාංශ | | |
| හිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | |
| උපණය අය කර ගැනීම | | |
| අත්තිකාරම් අය කර ගැනීම | 600,208.00 | 491,848.00 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **600,208.00** | 491,848.00 |
| | | |
| **<u>අඩු කළා - මුදල් වැය කිරීම</u>** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් | 833,942,260.00 | 393,432,000.00 |
| අත්තිකාරම් ගෙවීම් | 15,459,019.00 | 24,129,703.00 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **849,401,279.00** | 417,561,703.00 |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ) = (ඈ) - (ඉ)** | **(848,801,071.00)** | **(417,069,855.00)** |
| | | |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ) = (ඇ) + (ඊ)** | **(8,012,062.00)** | 39,579,107.00 |
| | | |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| දේශීය ණය ගැනීම් | | |
| විදේශීය ණය ගැනීම් | | |
| ප්‍රදානයන් ලැබීම් | | |
| තැන්පතු ලැබීම් | 1,302,292,504.00 | 1,946,451,261.00 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් (ඌ)** | **1,302,292,504.00** | 1,946,451,261.00 |
| | | |
| **<u>අඩු කළා - මුදල් වැය කිරීම</u>** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | |

| | | |
|---|---|---|
| විදේශීය ණය ආපසු ගෙවීම් | | |
| තැන්පතු ගෙවීම් | 1,294,280,442.00 | 1,907,825,915.00 |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | **1,294,280,442.00** | 1,907,825,915.00 |
| | | |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ) = (ඌ) - (එ) | **8,012,062.00** | 38,625,346.00 |
| | | |
| මුදල්වල ශුද්ධ වෙනස් වීම් (ඔ) = (උ) - (ඒ) | | 953,761.00 |
| | | |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | | |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | | 953,761.00 |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්ත මේන්තු වේ % ලෙස |
| | <u>දේශීය භාණ්ඩ හා සේවා මත බද්ද</u> | | | | |
| 1003 | බලපත්‍ර ගාස්තු හා වෙනත් | | | | |
| 1003.01.00 | සුඛෝපභෝගී මෝටර් රථ වාහන බද්ද | 700,000,000.00 | 1,500,000,000.00 | 1,614,916,914.00 | 107.66 |
| `1003.02.00 | පැවරුම් බද්ද | | | | |
| 1003.07.00 | අනෙකුත් බලපත්‍ර ගාස්තු | | | | |
| 1003.07.04 | මෝටර් රථ විකිණීම මත බදු | 80,000,000.00 | 55,000,000.00 | 65,617,489.00 | 119.30 |
| 1003.07.09 | කාබන් බද්ද | 1,500,000,000.00 | 90,000,000.00 | 102,775,391.00 | 114.19 |
| | | **2,280,000,000.00** | **1,645,000,000.00** | **1,783,309,794.00** | 108.41 |
| | | | | | |
| | <u>බදු නොවන ආදායම</u> | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2003.02.14 | මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ අයකරනු ලබන ගාස්තු සහ අනෙකුත් | 10,000,000,000.00 | 6,800,000,000.00 | 7,236,841,853.00 | 106.42 |
| 2003.02.15 | සහනදායී මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම යටතේ මෝටර් රථ පැවරීමේදී අයකරනු ලබන ලියාපදිංචි කිරීමේ ගාස්තු | 5,000,000.00 | | 6,692,438.00 | 133.85 |
| | අනෙකුත් ප්‍රභවයන්ගෙන් ලද ආදායම (ආ) | | | | |
| | මුළු බදු නොවන ආදායම (අ) + (ආ) | 10,005,000,000.00 | 6,800,000,000.00 | 7,243,534,291.00 | 106.52 |
| | මුළු ආදායම | **12,285,000,000.00** | **8,445,000,000.00** | **9,026,844,085.00** | **106.89** |
| | | | | | |

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.) | | තත්‍ය වියදම (රු.) | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 1,657,382,000.00 | 1,657,382,000.00 | 1,483,244,742.00 | 89.49 |
| ප්‍රාග්ධන | 1,006,058,000.00 | 1,006,058,000.00 | 850,879,219.00 | 84.58 |

### 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය ලද ප්‍රතිපාදන

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන (රු.මි.) | | තත්‍ය වියදම (රු.මි.) | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 01 | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | | 642 | - | 5 | 6% |
| | | | | | | |

### 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2020 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2020 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු.) | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | | 213,177,095.00 | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | | 179,582,367.02 | | |
| 9153 | ඉඩම් | | | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | 2,909,120.12 | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9166 | කෙරීගෙන යන වැඩ | | 273,453,157.14 | | |
| 9182 | කල් බදු වත්කම් | | 33,700,000.00 | | |

### 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ඇමුණුම 1 මගින් දැක්වේ.

# 04 පරිච්ඡේදය

## 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව වැඩසටහන් ගණනාවක් හඳුනා ගෙන තිබූ අතර එම එක්, එක් ව්‍යාපෘතීන්හි ප්‍රගතිය පහත සටහනින් දැක්වේ.

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| භෞතික සම්පත් සංවර්ධනය යටතේ ඉදිකිරීම් හා අළුත්වැඩියාවන් වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය | 99.54% | | |
| ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම යටතේ දෘඪාංග හා මෘදුකාංග අත්පත් කර ගැනීමේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය | | | 0.07% |
| මානව සම්පත් සංවර්ධනය සඳහා සිදු කර ඇති වැඩසටහන් ගණන හා එහි මූල්‍ය ප්‍රගතිය | 95% | | |
| මූලධන ආයෝජන යටතේ රියදුරු බලපත්‍ර නිකුත් කර ඇති ප්‍රමාණය සහ ඒ සඳහා කර ඇති වියදම | | 88.64% | |

- රජයේ දෙපාර්තමේන්තු අතර ඉතා ඈත අතීතයකට හිමිකම් කියන මෙම දෙපාර්තමේන්තුව නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලය, වේරහැර කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල පද්ධතියකින් සන්නද්ධව කටයුතු කරයි. මෙම දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලි බොහෝමයක්ම ඉපැරණි බව නිසාම වරින් වර අළුත්වැඩියාවන්ට ලක් කළ යුතු මට්ටමේ පවතින අතර, ඒ නිසාම අත්‍යවශ්‍ය ඉදිකිරීම් හා අළුත්වැඩියාවන්ට වැඩි ප්‍රමුඛතාවක් ලබා දීමට සිදුව තිබේ. ඒ අනුව පසුගිය වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ මේ සඳහා ප්‍රමුඛතාවය යොමු වූ අතර, රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය මත එම කටයුතු සිදු කිරීමට නොහැකි විය.

- අප දෙපාර්තමේන්තුව "A ශ්‍රේණියේ" දෙපාර්තමේන්තුවක් වශයෙන් වාර්ෂිකව විශාල වැඩ ධාරිතාවක් සිදු කරනු ලබන ආයතනයකි. මෝටර් රථ ලියාපදිංචිය හා රියදුරු බලපත්‍ර නිකුත් කිරීමට අදාළ මෙම සේවාවන් සඳහා යොමු වන සුවිශාල සේවාලාභීන්ට සාපේක්ෂව ඔවුන් සඳහා

අවශ්‍ය සේවාවන් සැපයීම සඳහා අවශ්‍ය තාක්ෂණික උපකරණ මිල දී ගැනීම හා අළුත්වැඩියාව වෙනුවෙන් විශේෂ අවධානයක් යොමු කිරීමට අප දෙපාර්තමේන්තුවට සිදුවේ. මීට අමතරව උසස් මට්ටමේ සේවාවක් සැපයීම සඳහා මෘදුකාංග සංවර්ධනය කිරිම සඳහා දීර්ඝ කාලීන ව්‍යාපෘති කිහිපයක් බාහිර සේවා සැපයුම් ආයතන සමඟ අප දෙපාර්තමේන්තුව සිදු කරයි.

- දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය සම්බන්ධයෙන් විශ්ලේෂණය කර බැලීමේදී දෙපාර්තමේන්තුගත අභ්‍යන්තර කාර්ය මණ්ඩලයත් ඒකාබද්ධ සේවය ඇතුළු අනෙකුත් සේවාවන් හරහා අනුයුක්ත කාර්ය මණ්ඩලයත් නිරන්තර පුහුණුව හා සංවර්ධනය තුළින් අභිප්‍රේරණය කිරීම සේවා සැපයුම් වල ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා ඉතා වැදගත් බව හඳුනා ගෙන ඇත. මෙම වසරේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය මත පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු නොකරන ලදී.

- දෙපාර්තමේන්තුව මඟින් සේවා සැපයුම් වර්ධනය කර ගැනීම සඳහා බාහිර ආයතන ගණනාවක් සමඟ ගිවිසුම්ගතව කටයුතු කරන අතර රියදුරු බලපත්‍ර මුද්‍රණය, අංක තහඩු මුද්‍රණය වැනි කාර්යයන් මේ අතර ප්‍රධාන වේ. එමඟින් අත්පත් කර ගෙන ඇති ප්‍රගතිය ප්‍රශස්ත මට්ටමක පවතී.

# 05 පරිච්ඡේදය

## තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

| ඉලක්කය / අරමුණ | ඉලක්කය සපුරා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| **නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම**<br><br>2030 වන විට මහාමාර්ග වල අනතුරු වලින් සිදු වන තුවාල වීම් සහ මරණ සංඛ්‍යාව අඩු කිරීම. | මාර්ග වල ධාවනය කරන රථ වාහන වල ප්‍රමිතිය පවත්වාගෙන යාම සඳහා<br>• වාහන ආනයනයේදී ප්‍රමිතියට අනුකූල වාහන පමණක් ලියාපදිංචි කිරීම<br>• මාර්ග වල ධාවනයේදී හදිසි පරීක්ෂා කිරීම් සිදු කිරීම<br><br>රථ වාහන ධාවනය සඳහා රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේදී<br>• න්‍යායාත්මක දැනුම හා ප්‍රායෝගික පුහුණුව පරීක්ෂා කර රියදුරු බලපත්‍ර නිකුත් කිරීම<br>• රියදුරු බලපත්‍ර අළුත් කිරීමේදී ශාරීරික යෝග්‍යතාවය නැවත සලකා බැලීම<br>• රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේදී වයස් සීමාවන් සලකා බැලීම<br>• ආබාධිතයින් විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින් සඳහා විශේෂිත ක්‍රමවේදයක් අනුගමනය කිරීම<br>• පොදු මගී ප්‍රවාහනය සඳහා විශේෂ සටහනක් සහිතව රියදුරු බලපත්‍ර නිකුත් කිරීම<br>• රියදුරන් සඳහා අවාසි සහගත ලකුණු ලබා දීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම | වාර්ෂිකව රිය අනතුරු වලින් සිදු වන තුවාල වීම් හා මරණ සංඛ්‍යාවේ ප්‍රතිශතාත්මක වෙනස | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2030 වන විට රසායනික,වාතය , ජලය සහ පස දූෂණය වීමත් අපිරිසිදු වීම නිසා ඇතිවන මරණ සහ රෝගී තත්වයන් සැලකිය යුතු මට්ටමින් අඩු කිරීම.<br><br>2030 වන විට ජල දූෂණය අඩු කරමින් ජලය ගුණාත්මක භාවය ඉහල නැංවීම සඳහා විෂ රසායනික ද්‍රව්‍ය හා වෙනත් ද්‍රව්‍ය බැහැර කිරීම අඩු කිරීම.<br><br>2030 වන විට වාතය ගුණාත්මක භාවය කළමනාකරණය තුළින් අහිතකර පරිසර බලපෑම අඩු කිරීම<br><br>2020 වන විට එකඟතාවයට පත්ව ඇති අන්තර්ජාතික වැඩ සැලැස්මට අනුව පරිසර හිතකාමී අන්දමින් රසායන ද්‍රව්‍ය හා අපද්‍රව්‍ය පරිසරයට මුදා හැරීම | • වාහන වලින් පිටවන විෂ දුම් පාලනය කිරීම සඳහා රථ වාහන වල වායු විමෝචන පරික්ෂාවන් සිදු කිරීම<br><br>• ගරාජ් ලියාපදිංචි කිරීමේදී නිසි පරිදි අපජලය හා අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේදයන් පරික්ෂා කිරීම<br><br>ශබ්ද දූෂණය වැලැක්වීම සඳහා නලා, ශබ්ද වාහිනි යන්ත්‍ර වාදනය කිරීමේ ප්‍රමිතිය පරික්ෂා කිරීම | වාහන වලින් විෂ දුම් නිකුත් වීම සම්බන්ධයෙන් ලැබෙන මහජන පැමිණිලි වල අඩුවැඩි වීම<br><br>ගරාජ් ලියාපදිංචි කිරීමේදී පිරිපහදු නොකළ අපජලය ජල මූලාශ්‍ර වලට මුදා හැරීම සම්බන්ධයෙන් වන පැමිණිලි සංඛ්‍යාවේ අඩුවැඩි වීම<br><br>ශබ්ද දූෂණය සම්බන්ධයෙන් ලැබෙන මහජන පැමිණිලි වල අඩුවැඩි වීම | | | |
| පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම හා සැමට ජීවිත කාලය පුරා ඉගෙනීම සැලසීම<br><br>සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම් කුසලතා ලබා සිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව ඉහල නැංවීම | • එක් එක් වාහන පංති හඳුන්වා දෙමින් ඒ සඳහා පුහුණුව ලබා දිය හැකි ආයතන ශ්‍රේණි ගත කිරීම හා නියාමනය<br><br>ලිඛිත හා ප්‍රායෝගික පරික්ෂණ හරහා රියදුරු බලපත්‍ර ලබා දීමේ ක්‍රමවේදයක් පවත්වාගෙන යාම හා ඒ සඳහා වයස අවුරුදු 18 ට වැඩි පුරවැසියන්ට අවස්ථාව ලබා දීම | රියදුරු පාසල් නියාමනය කිරීමේදී වාර්තා වන ගැටළු හා අඩුපාඩු වල සංඛ්‍යාත්මක අඩුවැඩි වීම | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2020 වන විට අධ්‍යාපනය නොලබන පුහුණුවක් නොලබන රැකියාවක් නොමැති යෞවනයින්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමකින් අඩු කිරීම | | | | | |
| **තිරසර සංවර්ධනය සඳහා ඵලදායී වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම.**<br><br>සියළුම ආකාරයේ අල්ලස හා දූෂණය කැපී පෙනෙන ලෙස අඩු කිරීම<br><br>ඵලදායී විනිවිධ භාවයෙන් යුත් ආයතන පිහිටුවීම | • අල්ලස හා දූෂණය අවම කිරීම සඳහා නවීන තොරතුරු තාක්ෂණික ක්‍රම කෙරෙහි වැඩි වශයෙන් නැඹුරුව සේවා සැපයීම<br><br>• අල්ලස හා දූෂණයට එරෙහිව ක්‍රියා කිරීමට ආයතනය තුළ දැනුවත් කිරීම් සිදු කර තිබීම හා පැමිණිලි කිරීමට පහසුකම් සපයා තිබීම.<br><br>• තොරතුරු නිලධාරීන් හරහා මහජනතාව වෙත අවශ්‍ය තොරතුරු සැපයීමට ක්‍රමවේදයක් සකස් කිරීම. | අල්ලස් හා දූෂණ චෝදනා සම්බන්ධයෙන් සනාථ වන චෝදනා සංඛ්‍යාවේ අඩුවැඩි වීම | | | |

## 5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

අප දෙපාර්තමේන්තුව විසින් හඳුනා ගෙන ඇති තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීමෙහිලා බාධා වන කරුණු ගණනාවක් පහත පරිදි හඳුනා ගත හැකිය.

| අනු අංකය | ඉලක්කය | ඉලක්ක සපුරා ගැනීමට බාධා වන කරුණු |
|---|---|---|
| 1. | 2030 වන විට මහාමාර්ග වල අනතුරු වලින් සිදු වන තුවාල වීම් සහ මරණ සංඛ්‍යාව අඩු කිරීම. | වාහනවල තත්ත්ව නියාමනය කිරීම සඳහා සිදු කෙරෙන හදිසි පරීක්ෂා කිරීම් ප්‍රමාණය මානව හා භෞතික සම්පත්වල පවත්නා ඌනතාවයන් හේතුවෙන් අවම වී ඇත.<br>මාර්ග පද්ධතියේ පවත්නා ඌන සංවර්ධිත තත්ත්වයන් වාහනවල නියමිත තත්ත්වයෙන් පවත්වා ගෙන යාමට බාධාකාරී වේ.<br>රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රායෝගික පරීක්ෂණවල ප්‍රමිතිය මැන බැලීම සඳහා නවීන තාක්ෂණික ක්‍රමවේදයන් ප්‍රමාණාත්මකව හඳුන්වා දී නොතිබීම. |

| | | |
|---|---|---|
| | | රියදුරන් සඳහා අඛණ්ඩ විධිමත් පුහුණු පාඨමාලාවන් මෙතෙක් සැලසුම් නොවීම.<br>රියදුරන් සඳහා අවාසිදායක ලකුණු ලබා දීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය ආයතන ගණනාවක් හා ඒකාබද්ධව පවතින බැවින් තවදුරටත් සක්‍රීය නොවීම. |
| 2. | 2030 වන විට රසායනික, වාතය, ජලය සහ පස දූෂණය වීමත් අපිරිසිදු වීම නිසා ඇතිවන මරණ සහ රෝගී තත්වයන් සැලකිය යුතු මට්ටමින් අඩු කිරීම. | ව්‍යාජ ක්‍රමවේද හරහා දුම් පරීක්ෂණය සමත් වීමට ඇති පෙළඹවීම.<br>ගරාජ ලියාපදිංචි කිරීමෙන් පසු සුපරීක්ෂණය සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීම.<br>පොදු මහජනතාව මෙම ක්ෂේත්‍රයන්හි හඳුනා ගනු ලබන ගැටළු, ඒ සඳහා වගකීම දරණ ආයතන වෙත පැමිණිලි කිරීමට මැලි වීම. |
| 3. | පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම හා සැමට ජීවිත කාලය පුරා ඉගෙනීම සැලසීම | රියදුරු පුහුණුව ලබන පුහුණුලාභීන් ප්‍රමාණාත්මක හා ගුණාත්මක පුහුණු වීමක් රහිතව රියදුරු බලපත්‍රයක් ලබා ගැනීමට උත්සාහ කිරීම. |
| 4. | තිරසර සංවර්ධනය සඳහා ඵලදායී වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම. | සේවකයින් හා සේවාලාභීන් අතර පවත්නා අයහපත් ආකල්ප හේතුවෙන් අල්ලස් හා දූෂණ වලට පෙළඹී කටයුතු කිරීම. |

# 06 පරිච්ඡේදය

## මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත) ** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 30 | 27 | 03 |
| තෘතියික | 21 | 4 | 17 |
| ද්විතියික | 823 | 727 | 96 |
| ප්‍රාථමික | 138 | 121 | 17 |

### 6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ඇත්තේ කෙසේද

- ✓ දෙපාර්තමේන්තුව තුළ පවත්නා ආයතනවල නඩත්තු කටයුතු පවත්වා ගෙන යාම සඳහා තාක්ෂණික දැනුම සහිත නිලධාරීන් අනුයුක්ත නොවීම හේතුවෙන් අත්‍යවශ්‍ය රාජකාරීමය කටයුතු වලදී පවා බාධාවන් එල්ල වේ. උදාහරණ වශයෙන් ඇස්තමේන්තු සකස් කර ගැනිම සඳහා කාර්මික නිලධාරියෙකු නොවීම, යන්ත්‍ර හෝ යන්ත්‍රෝපකරණ වල සුළු අළුත්වැඩියාවන් සිදු කර ගැනීමට ප්‍රමාණාත්මක දැනුමක් සහිත නිලධාරීන් අනුයුක්ත නොවීම සඳහන් කළ හැකිය.

- ✓ අප දෙපාර්තමේන්තුව මඟින් සපයන කාර්මික සේවාවන් සැපයීම සඳහා මෝටර් රථ පරීක්ෂකවරුන්ගේ පුරප්පාඩු හේතුවෙන් බාධා මතුවීම.

- ✓ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ නිරන්තරයෙන් යෙදෙන ආයතනයක් වශයෙන් මේ සඳහා ගණකාධිකාරීවරයෙකු යටතේ වෙනම ඒකකයක් ස්ථාපිත නොවීම හේතුවෙන් එම කටයුතුවලට බාධාකාරී ලෙස බලපෑම් ඇති වීම.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (රු.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම / ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| මෝටර් වාහන පරීක්ෂක තනතුර සඳහා බඳවා ගනු ලැබූ නවක නිලධාරීන් පුහුණු කිරීම | 22 | දින 45 | 100,000.00 | | දේශීය | 90% |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලැබූ මූලික GIS පුහුණු වැඩසටහන | 25 | දින 6 | 875,000.00 | | දේශීය | 95% |

# 07 පරිච්ඡේදය

## අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 01.0 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 01.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 01.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 01.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අනුකූල වේ | | |
| 01.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අනුකූල වේ | | |
| 01.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අනුකූල වේ | | |
| 01.6 | වෙනත් | අනුකූල වේ | | |
| 02.0 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 02.1 | රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙනයාම | අනුකූල වේ | | |
| 02.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙනයාම | අනුකූල වේ | | |
| 02.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙනයාම | අනුකූල වේ | | |
| 02.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙනයාම | අනුකූල වේ | | |
| 02.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 02.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙනයාම | අනුකූල වේ | | |
| 02.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන පවත්වා ගෙනයාම | අනුකූල වේ | | |
| 02.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙනයාම | අනුකූල වේ | | |
| 02.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙනයාම | අනුකූල වේ | | |
| 02.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙනයාම | අනුකූල වේ | | |
| 02.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වා ගෙනයාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 03.0 | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 03.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 03.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 03.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 03.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 04.0 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 04.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 04.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 04.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | | | |
| 04.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 04.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 05.0 | **විගණන විමසුම්** | | | |
| 05.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල නොවේ | ලේඛන පරීක්ෂා කිරීම සඳහා දීර්ඝ කාලයක් ගත වීම | ඊ-මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මඟින් ඉදිරියේදී මෙවැනි ගැටළු තත්ත්වයන් මඟ හරවා ගත හැකිය. |
| 06.0 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 06.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 06.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | නිලධාරීන් ඒ කෙරෙහි උනන්දුවක් නොදැක්වීම | නිලධාරීන් දැනුවත් කර ඇත. |
| 06.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 06.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාදිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 07.0 | **විගණන කළමනාකරණ කමිටු** | | | |
| 07.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ගය තුළ පවත්වා ගෙන තිබීම | අනුකූල වේ | | |
| 08.0 | **වත්කම් කළමනාකරණය** | | | |
| 08.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 08.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍ර ලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල නොවේ | මෙතෙක් ඒ සඳහා නිලධාරියෙකු පත් කර නොතිබීම | නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කරමි. |
| 08.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 08.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල නොවේ | විවිධ හේතු මත කාල රාමුව තුළින් කටයුතු සිදු නොකිරීම | නිලධාරීන් දැනුවත් කර ඇත. |
| 08.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල නොවේ | නිසි පරිදි එම කටයුතු අධීක්ෂණය නොවීම | නිලධාරීන් දැනුවත් කර ඇත. |
| 09.0 | **වාහන කළමනාකරණය** | | | |
| 09.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 09.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 09.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 09.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 09.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 09.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 10.0 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ ක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුත්ව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | | බැංකු ප්‍රකාශන විධිමත්ව ඉදිරිපත් කරන ලෙස බැංකුවට උපදෙස් දී ඇත. |
| 11.0 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන පද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල නොවේ | ප්‍රමාණවත් අවධානයක් නොදැක්වීම | ඉදිරියේදී වළක්වා ගැනීමට කටයුතු යොදා ඇත. |
| 12.0 | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල නොවේ | ප්‍රමාණවත් අවධානයක් නොදැක්වීම | නිලධාරීන් දැනුවත් කර ඇත. |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | ණය ශේෂයන් තහවුරු කර ගැනීමට අපහසු වීම | භාණ්ඩාගාරයේ උපදෙස් ගැනීමට අපේක්ෂා කරමි. |
| 13.0 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 14.0 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| 15.0 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 16.0 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 17.0 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනිමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 18.0 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.0 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදයේ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| 20.0 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල නොවේ | යම් යම් උත්සාහයන් ගෙන ඇතත් තව දුරටත් අඩුපාඩු පැවතීම | ඉදිරියේදී එම අඩඅපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කිරීමට අපේක්ෂා කරමි. |

# ඇමුණුම 1

(92)

මගේ අංකය / எனது இல. / My No. PUR/C/DMT/2020/154(6) ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2021 ජුනි 3 දින

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්,

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව.

**මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගනය කළ මතය

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරන විගණන වාර්තාව පසුව ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි

අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණු බව.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

#### 1.6.1.1 ආදායම් ලැබීම්

සුඛෝපභෝගී මෝටර් වාහන බදු සම්බන්ධයෙන් 1995 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා හිඟ ආදායම් ගණනය කිරීම 2016 වර්ෂයේ ආරම්භ කර තිබුණ ද, එම හිඟ ආදායම් පිළිබඳ වාර්තා කිසිවක් පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කිරීමට පියවර ගෙන නොතිබුණි. මේ නිසා එම කාල පරිච්ඡේදයට අදාළ හිඟ ආදායම කොපමණ ද යන්න විගණනයේදී තහවුරු කරගත නොහැකි විය. කෙසේ නමුත්, 2009 වර්ෂයට පෙර වර්ෂ 13ක් වෙනුවෙන් එවකට අයකර තිබුණු හිඟ බදු ආදායම රු.34,898,108 කි.

#### 1.6.1.2 පුනරාවර්තන හා මූලධන වියදම්

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වියදම් ශේෂ, ඒසීඒ 2(ii) ආකෘති පත්‍රයට අනුව මුදලින් කළ වියදම සහ අනිකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් ශේෂවල එකතුව සමඟ සැසඳීමේ දී රු.2,092,955,819ක වෙනසක් පැවතුණි.

### 1.6.2 අක් මුදල් ගැලපුම් ගිණුම

අක් මුදල් ගැලපුම් ගිණුමේ දිස්ත්‍රික් කාර්යාල ලැබීම් හා ගෙවීම් ලෙස සටහන් කර තිබුණු ශේෂ, සිගාස් වැඩසටහන අනුව එම ශේෂ හා සැසඳීමේදී පිළිවෙලින් රු.36,156,577ක හා රු.12,379,811ක නොසැසඳුණු වෙනස්කම් පැවැතිණි.

### 1.6.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

එකතුව රු.86,071,226 ක් වූ වාහන 17ක්, දේපළ, පිරියත හා උපකරණ ස්ථාවර වත්කම් ලෙස ප්‍රාග්ධනීත කර නොතිබුණි.

### 1.6.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වියදම් ශේෂ, ඒසීඒ 2(ii) ආකෘති පත්‍රයේ මුදලින් සිදුකරන ලද වියදම් ශේෂ හා සැසඳීමේ දී රු. 2,049,622,835 ක නොසැසඳුණු වෙනසක් පැවතුණි.

88

### 1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | යාවත්කාලීන කර නොතිබුණි./පවත්වා නොතිබුණි. |
|---|---|---|
| (අ) ලියාපදිංචි කරන ලද සියලුම මෝටර් වාහනවල විස්තර අඩංගු වන පරිදි නියමිත ආකෘතියට අනුව සටහන් කළ ලේඛනය | මෝටර් වාහන පනත (203 වන අධිකාරය) 6(අ) වගන්තිය | පවත්වා නොතිබුණි. |
| (ආ) අවලංගු කරන ලද වාහන සම්බන්ධ ලේඛනය | මෝටර් වාහන පනත (203 වන අධිකාරය) 18(8)(අ) වගන්තිය | පවත්වා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මු.රෙ.128 (2) (ඇ) සහ අංක 01/2015 හා 2015 ජුලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 07 ඡේදය පරිදි, ආදායම් සංකේතාංක 04ක් වෙනුවෙන් 2020 වර්ෂයේ කාර්තුමය ආදායම් වාර්තා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු වුවත් 2021 පෙබරවාරි 25 දින වන විටත් අදාල ලේඛන පිළියෙල කර නොතිබුණි. එමෙන්ම, එක් ආදායම් සංකේතයක් යටතේ හිඟ ආදායම් පිළිබඳ අර්ධ වාර්ෂික වාර්තා ද කිසිවක් පිළියෙල කර නොතිබුණි.

(ආ) හිඟ හිටි ආදායම් ප්‍රකාශය අනුව, 2020 වර්ෂය තුළ අයකළ රු. 313,528,052 ක් වූ හිඟ ආදායම, සමාලෝචිත වර්ෂය, ඉකුත් වර්ෂය හා ඉකුත් වර්ෂයට පෙර වර්ෂ ලෙස වර්ගකර දක්වා නොතිබුණි.

(ඇ) වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව අනුව, ආදායම් සංකේතාංක 04ක සංශෝධිත ඇස්තමේන්තු වටිනාකම සහ ආදායම් ප්‍රකාශය අනුව එම සංශෝධිත ආදායම් ඇස්තමේන්තු අතර රු.1,012,000,000ක නොසැසඳුණු වෙනසක් පැවතුණි.

(ඈ) සුබෝපභෝගී බදු සඳහා වූ සමාලෝචිත වර්ෂයේ හිඟ හිටි ආදායම් ප්‍රකාශයේ ආරම්භක ශේෂය, ඉකුත් වර්ෂයේ එම ප්‍රකාශයේ අවසාන ශේෂය සමඟ සැසඳීමේ දී රු.426,827,000ක වෙනසක් පැවතිණි.

(ඉ) අංක 01/2015 හා 2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 04 ඡේදය පරිදි, හිඟ ආදායම් වෙනුවෙන් ක්‍රමවත් ව වාර්තා පැවැත්වීම හා හිඟ ආදායම් තවතවත් එකතුවීම වැළැක්වීමට පියවර ගෙන නොතිබුණි. සමස්ත හිඟ ආදායම වාර්ෂික ව දිගින් දිගටම වැඩිවීමේ ප්‍රවනතාවක් පැවැති අතර 2016 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ හිඟ ආදායම වැඩි වීම සියයට 318ක ප්‍රමාණාත්මක අගයක් ගෙන තිබුණි.

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 07ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 87ක් ඉතිරි වී තිබුණු අතර එම ඉතිරි වීම් සියයට 42ත් 100ත් අතර පරාසයක විය. කෙසේ නමුත්, කොවිඩ් 19 වසංගත තත්ත්වය මෙම ප්‍රතිපාදන ඉතිරිවීමට ප්‍රධාන හේතුව වී තිබුණි.

(ආ) වැය විෂයයන් 04ක ඇස්තමේන්තු වටිනාකමින් සියයට 31ත් 145ත් අතර ප්‍රතිශතයක් මු.රෙ.66 මගින් මාරු කරගෙන තිබුණි.

## 2.3 බැරකම් හා බැදීම්වලට එළැඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සටහන - (iii) ආකෘතිය අනුව වූ බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයක් පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ රු.4,600,822ක වියදම් 2021 වර්ෂයේ දී පියවා තිබුණ ද, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී එම වියදම් බැරකම් ලෙස හඳුනා ගෙන නොතිබුණි.

## 2.4 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය

අංක ඒසීඒ-06 දරන මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ, වෙනත් යන්ත්‍ර හා උපකරණ අනු කේත අංක 05කට වර්ගකර තිබුණ ද, වර්ෂය තුළ මිල දී ගත් රු.1,880,273ක උපකරණ එම කේත අංක යටතේ වර්ග කර නොතිබුණි.

86

## 2.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.4 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

## 2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති හෝ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනත 42 වන වගන්තිය | වාහන ලියාපදිංචි කිරීම් සම්බන්ධ ලිපිගොනු සහ විගණන අවශ්‍යතා වෙනුවෙන් ඉල්ලා සිටි තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණු අවස්ථා විය. |
| (ආ) මෝටර් වාහන පනත (203 වන අධිකාරය) | |
| (i) 18 (3) උපවගන්තිය | වර්ෂ 02ක් ඉක්මවා ආදායම් බලපත්‍ර අළුත් කර ගැනීම සඳහා ඉදිරිපත් වන අවස්ථාවල දී ඒ පිළිබඳ පළාත් අධිකාරීන් විසින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය උපදෙස් හෝ අනුමැතිය ලබා ගැනීමේ පිළිවෙතක් නොතිබීම නිසා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා හට එම වාහනවල ලියාපදිංචිය අවලංගු කිරීමට තිබුණු හැකියාව ගිලිහී ගොස් තිබුණි. |
| (ii) 18 (7) උපවගන්තිය | ලියාපදිංචිය අවලංගු කළ වාහනවල අංක තහඩු දින 07ක් ඇතුළත ආපසු භාර දිය යුතු වුවත්, 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා |

කාලය තුළ අවලංගු කළ වාහන 872ක අංක තහඩු දෙපාර්තමේන්තුව වෙත භාර දී නොතිබුණි.

| | |
|---|---|
| (iii)18 (13) උපවගන්තිය | වාහන අවලංගු කිරීම හා ඒවා බැහැර කිරීම අවිධිමත් ලෙස සිදුකර තිබුණි. අවලංගු කරන ලද වාහන බැහැර කිරීම සහ ඒ වෙනුවෙන් නඩත්තු කළ යුතු වාර්තා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සකස් කර නොතිබීම ඊට හේතුවක් විය. |
| (iv) 25 (1) උපවගන්තිය | ආදායම් බලපත්‍රයක් නොමැතිව මෝටර් වාහනයක් සන්තකයේ තබාගත නොහැකි වුවද, වාහන 03ක පළමු ලියාපදිංචි දිනයේ සිට වසර 15ක් ඉක්මවා යනතුරුත් ආදායම් බලපත්‍ර ලබා ගෙන නොතිබීම මතභේදාත්මක විය. |
| (v) 30(1)(ඊ)(III) උපවගන්තිය | (i) වාහනයක පළමු ලියාපදිංචි දින සිට දින 03ක් ඇතුළත ආදායම් බලපත්‍රය ලබාගත යුතු වුවද, වාහන 05ක් සඳහා පළමු ලියාපදිංචි දින සිට වසර 23 සිට 27 දක්වා දීර්ඝ කාලයකට එකවර ආදායම් බලපත්‍ර ලබා ගෙන තිබුණි.<br>(ii) නිෂ්පාදිත වර්ෂයේ සිට වර්ෂ 03කට වඩා පැරණි මෝටර් කාර් ශ්‍රී ලංකාවට ආනයනය කළ නොහැකි වුවද, නිෂ්පාදිත වර්ෂයේ සිට වසර 07ක් හා 08ක් පැරණි වාහන 02ක් ලියාපදිංචි කර තිබුණි. |

## 2.7 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මිය ගොස් වර්ෂ 05 කට වඩා කල්ගත වී තිබුණු එකතුව රු.536,749 ක ණය ශේෂ නිරවුල් කර නොතිබීම ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 වැනි වගන්තියට පටහැනි විය.

(ආ) මු.රෙ 485(4)සහ අංක 89 හා 1993 ඔක්තෝබර් 22 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය පරිදි ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ තෙමසක් තුළ නිරවුල් කළ යුතු වුවද, 2020 දෙසැම්බර් 31 දිනට එ ලෙස නිරවුල් නොකළ වර්ෂ 05 ක කාල සීමාවක් ද ඉක්මවා ගොස් තිබුණු රු.226,230 ක ණය ශේෂ 04 ක් පැවතිණි.

(ඇ) විශ්‍රාම වැටුප් අත්හිටවූ නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු වූ රු.302,722 ක ණය ශේෂය වර්ෂ 05 කට වඩා පැරණි විය.

(ඈ) අවසාන වාරිකය අයකර වර්ෂ 02කට වඩා කල්ගත වී තිබුණු වැඩ තහනම් කළ නිලධාරීන් 19 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 1,330,463 ක ණය ශේෂ ඔවුන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් හෝ අය කිරීමට 2020 දෙසැම්බර් 31 දින දක්වාම පියවර ගෙන නොතිබුණි. ඒ අතර වර්ෂ 05 ඉක්ම වූ එකතුව රු.1,170,753 ක ශේෂ 17ක් විය.

(ඉ) අවසාන වාරිකය අයකර වර්ෂ 05 කට වඩා කල්ගත වී තිබුණු සේවය අත්හැර ගිය නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 234,042 ක ණය ශේෂ ඔවුන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් හෝ අයකර ගැනීමට 2020 දෙසැම්බර් 31 දින වන විටත් පියවර ගෙන නොතිබුණි.

(ඊ) කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට එකතුව හා එදිනට දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය අතර රු. 2,359,113 ක වෙනසක් විය. එය වසර ගණනාවක සිට පැවත එන ගිණුම්කරණ දෝෂ බව ගිණුම් වාර්තාවල සඳහන් කර තිබුණි.

**2.8** තැන්පතු
----------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එක් තැන්පත් ගිණුමකට අදාළව 2020 දෙසැම්බර් 31 දිනට වර්ෂ 04 ඉක්ම වූ රු.24,179,394ක තැන්පතු ශේෂ 12ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) මු.රෙ.571 (1) පරිදි, සෑම අර්ධ වර්ෂයක් අවසානයේදීම කල් ඉකුත් වූ සියලුම තැන්පතු පිළිබඳ ලැයිස්තු පිළියෙල කර නොතිබුණි.

(ඇ) තැන්පතු ගිණුම් 03 ක කේවල ශේෂ ලැයිස්තු අනුව, 2020 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් කාර්යාලවල පැවැති රු. 5,708,778ක තැන්පතු ශේෂවල විශ්ලේෂණයක් නොතිබීම නිසා ඒවා කුමන දිස්ත්‍රික් කාර්යාලවලට අදාළ කෙතරම් පැරණි ශේෂ ද, යන්න පිළිබඳ තහවුරුවක් ලබාගත නොහැකි විය.

(ඈ) අංක 01/2015 හා 2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 04 (ඇ) ඡේදයට අනුව තැන්පතු ගිණුම්වල පවතින ආදායම්, එළැඹෙන මාසයේ පළමු සතිය තුළ නිරවුල් කළ යුතුය. එහෙත්, පළාත් සභා වෙනුවෙන් එකතු කළ ආදායම් ඊට අනුකූලව ප්‍රේෂණය කර නොතිබුණි. එමෙන්ම, නිරවුල් නොකළ රු. 550,687ක ආරම්භක ශේෂයක් ඉදිරි වර්ෂයට ද බලපාන පරිදි වර්ෂය පුරා පැවතුණි.

2.9 බැංකු ගිණුම් මෙහෙයවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බැංකු ජංගම ගිණුමක 2020 දෙසැම්බර් 31 දිනට පිළියෙල කළ බැංකු සැසඳුම් ප්‍රකාශයේ පැවැති රු. 970,612ක හඳුනා නොගත් ගෙවීම් හා රු. 6,994,558ක හඳුනා නොගත් ලැබීම් නිරවුල් කර ගැනීමෙන් පසු බැංකු ප්‍රකාශන පිළියෙල කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) නිකුත් කළ නමුත් 2020 දෙසැම්බර් 31 දිනට මාස 06 ඉක්මවූ රු. 2,238,324ක චෙක්පත් මු.රෙ. 396(ඈ) පරිදි ආදායමට බැරකර නොතිබුණු අතර එම වටිනාකම තුළ වර්ෂය ඉක්ම වූ රු. 490,693ක චෙක්පත් ද පැවැතිණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ රු. 306,124,336 ක සුඛෝපභෝගී බදු ආදායමක් බැර කර තිබුණු බැංකු ජංගම ගිණුමක තොරතුරු, අංක 5/2007 සහ 2007 සැප්තැම්බර් 05 දිනැති භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය පරිදි මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

(අ) රේගු බදු නොගෙවා නීති විරෝධී ලෙස මෙරටට ආනයනය කළ හෝ මෙරට දී නීති විරෝධී ලෙස එකලස් කළ හෝ වාහන 33ක දත්ත දෙපාර්තමේන්තු පරිගණක පද්ධතියට සාවද්‍ය ලෙස ඇතුළත් කරමින් එම වාහන නීත්‍යානුකූල වාහන ලෙස මෙරට භාවිතය සඳහා මුදා හැර තිබීම නිසා ඉන් වාහන 21ක් සඳහා පමණක් දළ වශයෙන් නිෂ්පාදන බදු , සුඛෝපභෝගී බදු සහ අනෙකුත් රජයේ අය කිරීම් ලෙස රු. 558,640,627ක ආදායමක් රජයට අහිමි වී තිබුණි. එමෙන්ම, මෙම වාහන සම්බන්ධයෙන් මුල් ලිපිගොනු නඩත්තු කිරීමට ද දෙපාර්තමේන්තුව පියවර ගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ.

(i) මර්සිඩීස් බෙන්ස් රථයක් ලියාපදිංචි කිරීම සඳහා දැනට භාවිතයේ නොමැති 302 අංක කාණ්ඩය යටතේ පැවැති එවකට ලියාපදිංචි අංක අනුපිළිවෙලින් මගහැරී තිබුණු අංකයක් භාවිතයට ගෙන තිබුණි. මෙවැනි පැරණි අංකයක් නව අංකයක් ලෙස වර්තමානයේ ලියාපදිංචි කළ නොහැකි බැවින් 2000 වර්ෂයේ ලියාපදිංචි කරන ලද ටොයොටා කරීනා මාදිලියේ මෝටර් රථයක දත්ත එම බෙන්ස් රථයේ දත්ත ලෙස පරිගණකගත කර තිබුණි. මෙම රථය වෙනුවෙන් අතීත වර්ෂ 16ක් සඳහා එක්වර ආදායම් බලපත්‍ර ලබා ගෙන තිබුණු අතර සුඛෝපභෝගී බදු නොගෙවීම නිසා රජයට සිදු වූ පාඩුව රු. 307,500කි.

(ii) අංක 302 කාණ්ඩයේ මෝටර් රථ 02ක පළමු ලියාපදිංචිය පිළිබඳ දත්ත සහ අදාළ රේගු සටහන්කර පිළිබඳ තොරතුරු කිසිවක් පරිගණක පද්ධතියේ නොතිබුණි.

(iii) බර වාහන 02ක් (Used Wheel Loaders) හා බර එසවුම් උපකරණ 02ක් (Used Toyota Diesel Forklifts) ශ්‍රී ලංකාවට ආනයනය කළ රේගු සටහන්කරයක් උපයෝගී කරගෙන TOYOTA LEXUS, MITSUBISHI MONTERO PEJERO හා TOYOTA LAND CRUISER PRADO වර්ගයේ අධි සුඛෝපභෝගී මෝටර් කාර් 03ක් සාවද්‍ය ලෙස ලියාපදිංචි කිරීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව පියවර ගැනීම නිසා රජයට අහිමි වූ ආනයන තීරුබදු හා සුඛෝපභෝගී බදු ආදායම දළ වශයෙන් රු. 141,174,339ක් විය. මෙම වාහන රේගුව මගින් වෙන්දේසි කළ වාහන බවට පරිගණක පද්ධතියේ සටහන් කර තිබුණ ද, ඒ කිසිවක් රේගු වෙන්දේසියකට යොමු වී නොතිබුණි.

(iv) රේගු සබඳතාවක් නොතිබුණු මිට්සුබිෂි ජීප් රථයක් 2002 නොවැම්බර් 22 දින ලියාපදිංචි කර තිබුණි. එම ලියාපදිංචි අංකයට පෙර හා පසු අංක පිළිවෙලින් 2002 නොවැම්බර් 22 සහ 25 දෙ දින ලියාපදිංචි කළ ත්‍රීරෝද රථ 02ක් වන අතර ඊට අදාළ රේගු සබඳතා (Custom Link) දෙපාර්තමේන්තු පරිගණක වැඩසටහන තුළ පැවතුණි. එමෙන්ම, මෙම වාහනය සඳහා 2002 වර්ෂය සිට වර්ෂ 17ක ආදායම් බලපත්‍ර ගාස්තු එකවර ගෙවා 2018 වර්ෂයේදී ආදායම් බලපත්‍ර ලබා ගෙන තිබුණි.

(v) වාහන 03ක් සාවද්‍ය ලෙස ලියාපදිංචි කිරීම නිසා දළ වශයෙන් නිෂ්පාදන හා සුඛෝපභෝගී බදු ලෙස රු.114,597,000ක ආදායමක් රජයට අහිමි වී තිබුණි. එම වාහනවලට අදාළ රේගු සටහන්කර දත්ත කිසිවක් පරිගණක පද්ධතියේ නොමැති වීම, චැසි අංක සම්බන්ධයෙන් කිසිදු ආනයන වාර්තාවක් රේගු දත්ත තුළ නොමැති බව ශ්‍රී ලංකා රේගුව විසින් දන්වා තිබීම, පළමු ලියාපදිංචිය 2002 වර්ෂය ලෙස දැක්වුව ද, එ දින සිට සියලු වර්ෂ වෙනුවෙන් ආදායම් බලපත්‍රය ලබාගැනීම 2018 වර්ෂය තුළ සිදුකර තිබීම යනාදී කරුණු සියල්ල අතාත්වික විය.

(vi) වර්ෂ 1992 සිට 2015 දක්වා කාල පරිච්ඡේදයට අදාළව මහ හැරුණු අංක භාවිතයෙන් පරිගණක පද්ධතියට සාවද්‍ය ලෙස දත්ත ඇතුළත් කර නව වාහන 05ක් ලියාපදිංචි කර තිබුණි. ඉන් එක් වාහනයක් වෙනුවෙන් රු. 4,249,600 ක නිෂ්පාදන බදු ආදායමක් රජයට අහිමි වී තිබුණි. වාහන 05ක් සඳහා රු. 99,200ක නව ලියාපදිංචිය සඳහා ගාස්තු අයකර නොතිබුණු අතර එක් වාහනයක් වෙනුවෙන් අයවිය යුතු සුඛෝපභෝගී බදු මුදල රු. 295,000ක් විය.

(vii) සාවද්‍ය ලෙස ලියාපදිංචි කළ වාහන 17කින් වාහන 09ක් සඳහා පමණක් දළ වශයෙන් නිෂ්පාදන බදු , සුඛෝපභෝගී බදු සහ අනෙකුත් රජයේ ගාස්තු හා ආදායම් ලෙස රු. 297,057,788ක ආදායමක් රජයට අහිමි වී තිබුණි. ඒ හැර, අනුපිළිවෙලින් ලියාපදිංචි අංක නිකුත් නොකර සැලසුම් සහගතව යම් අංක ප්‍රමාණයක් හිස් ව තැබීම, පසුව එම හිස් අංක යොදා ගනිමින් වාහන ලියාපදිංචි කිරීම, පරිගණක පද්ධතියේ ආංශික දත්ත වාර්තා අසම්පූර්ණ වීම, රේගු සටහන්කර දත්ත පරිගණක පද්ධතියේ නොමැති වීම, වාහන 14ක පළමු ලියාපදිංචිය 1992 සිට 1997 වර්ෂය දක්වා කාලය තුළ සිදු කර ඇතත්, දත්ත පරිගණකගත කිරීම ඊට වසර 08 සිට 25 දක්වා කාලයකට පසුව සිදු කිරීම, එම පරිගණකගත කිරීමෙන් පසු ඊට ආසන්නතම දිනක වාහන 10 ක් සඳහා පළමු ආදායම් බලපත්‍රය ලබාගැනීම සහ ඉන් වාහන 04ක් ද ඇතුළුව වාහන 05ක් සඳහා වසර 23 සිට 27 දක්වා දීර්ඝ කාලයකට එකවර ආදායම් බලපත්‍ර ලබා ගැනීම යනාදී වශයෙන් නිරීක්ෂණය වූ කරුණු සියල්ල අතාත්වික විය.

(viii) අතීත වර්ෂ 18ක් වෙනුවෙන් 2018 වර්ෂයේදී එක්වර ආදායම් බලපත්‍ර ලබාගත්, 302 කාණ්ඩයේ මෝටර් රථයක මුල් ලියාපදිංචිය 2006 වර්ෂය ලෙස පරිගණක පද්ධතියේ සාවද්‍ය සටහන් තැබීම නිසා රු. 652,500ක සුඛෝපභෝගී බදු මුදලක් රජයට අහිමි වී තිබුණි.

(ආ) රජය සතු කැබ් රථයක ලියාපදිංචි අයිතිය පසුකාලීනව පුද්ගලයෙකු වෙත පවරා තිබුණි. රජය වෙනුවෙන් ආනයනය කළ එම වාහනය සඳහා 2013 වර්ෂයේදී නිදහස් කළ රු. 3,175,774 ක් වූ රේගු බදු මුදල අයකර නොතිබුණි. එමෙන්ම, 2013 වර්ෂයේ සිට මෙම වාහනයේ බලපත්‍ර අධිකාරිය වයඹ පළාත වුවද, 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ආදායම් බලපත්‍ර ගාස්තු 2019 වර්ෂයේදී බස්නාහිර පළාත් බලපත්‍ර අධිකාරිය විසින් එක්වර අයකර තිබීම ද ගැටළු සහගත විය.

(ඇ) විශේෂ කොන්දේසි කිසිවක් ලියාපදිංචි සහතිකයේ ඇතුළත් නොකර ද්විත්ව කාර්ය වාහන සඳහා වන ලියාපදිංචි අංක යටතේ විශේෂ කාර්යයන් සඳහා ආනයනය කළ වාහන ලියාපදිංචි කිරීම හේතුවෙන් 2018 හා 2019 වර්ෂවල දී වාහන 09ක් සඳහා පමණක් රු. 27,472,988ක රේගු බදු මුදලක් රජයට අහිමි වී තිබුණි.

(80)

**3.2** පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාහන අංක තහඩුවල පළාත් අක්ෂර මුද්‍රණය කිරීම නිසා වාහනයක අයිතිය පළාත් අතර විතැන් වීමේ දී නව අංක තහඩු මිල දී ගත යුතු විය. මෙම අක්ෂර මුද්‍රණය කිරීමෙන්, එම මුද්‍රණකරු උපයන ලාභය හැර වෙනත් කවර පාර්ශවයකට හෝ ලබාගත හැකි උපයෝගීතාවක් නිරීක්ෂණය නොවීය. ඒ අනුව, පසුගිය වර්ෂ 03ක කාලය තුළ පමණක් මෙලෙස පළාත් අතර විතැන් වූ වාහන 376,233ක අංක තහඩු වෙනුවෙන් මුද්‍රණකරු වෙත ගෙවා තිබුණු රු.778,448,278 ක මුදලේ ඵලදායකත්වය විගණනයේදී ප්‍රශ්නගත කරුණක් විය. එමෙන්ම, මේ නිසා ආනයනික තහඩු වෙනුවෙන් දල වශයෙන් වාර්ෂිකව රු. මිලියන 260ක විදේශ විනිමයක් ද වැයකර තිබුණි.

(ආ) වාහනවල අනන්‍යතාව හඳුනාගැනීම වෙනුවෙන් හඳුන්වා දී තිබුණු රේඩියෝ සංඛ්‍යාත දත්ත හඳුනාගැනීමේ අක්ෂරය සහිත ස්ටිකරය ප්‍රායෝගිකව භාවිතයට නොගන්නා බැවින්, ඒවා මුද්‍රණය කරන පෞද්ගලික සමාගම ලබාගන්නා ලාභය හැර වෙනත් කවර පාර්ශවයකට හෝ ලබාගත හැකි උපයෝජනයක් නිරීක්ෂණය නොවීය. උපයෝගීතාවක් තිබුණද, වාහන අංකය, පළාත, වැසි අංකය වැනි සීමිත දත්ත පමණක් ලබාදීම නිසා 2019 දෙසැම්බර් මාසයේ සිට 2020 අගෝස්තු දක්වා නිකුත් කළ ස්ටිකර් 302192 ක් වෙනුවෙන් එම පෞද්ගලික සමාගමට ගෙවූ රු. 153,059,534ක මුදල නිෂ්ඵල වියදමක් ලෙස නිරීක්ෂණය විය.

(ඇ) අංක තහඩු මුද්‍රණය විවිධ පරිමානවලින් සිදුකර තිබුණු අතර, ඒවායේ ගැනුම් පිරිවැය ද විවිධ මිල ගණන් යටතේ විය. එමෙන්ම, අංක තහඩුවල සටහන් කෙරෙන මතුපිට සලකුණු සියල්ල සියලු අංක තහඩු සඳහා ඒකාකාරී විය. එම සලකුණුවල පරිමානය හා ඝනත්වය අඩුවැඩි වශයෙන් පැවතුණ ද, එය පිරිවැය ඇගයීමෙහිලා අප්‍රමාණවත් සාධක විය. ඒ අනුව ඕනෑම පරිමානයක අංක තහඩුවක වර්ග මිලිමීටරයක ගැනුම් පිරිවැය සමාන විය යුතු විය. එහෙත් වැඩිම භාවිතයක් සහිත මි.මී. 300 x 80 හා මි.මි. 240 x 430 පරිමානයේ අංක තහඩුවල වර්ග මිලිමීටරයක පිරිවැය ඉහළ අගයක් ගෙන තිබුණු අතර, මි.මී.520 x 110 පරිමානයේ අංක තහඩුවක මිල සාපේක්ෂව අඩු අගයක් ගෙන තිබුණි. මි.මී.520 x110 තහඩුවේ විකුණුම් මිල සැපයුම්කරු විසින් තීරණය කර ඇත්තේ කිසියම් ලාභ ආන්තිකයක් සහිතව ය. ඒ අනුව එම ගැනුම් මිල පදනම ලෙස ගෙන ඉතිරි අංක තහඩුවලට කළ ගෙවීම් ගණනය කළ විට 2015 මැයි මාසයේ සිට 2019 ජූනි මාසය දක්වා කාලය තුළ නිකුත් කළ අංක තහඩු වෙනුවෙන් රු. 719,182,714 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

79

(ඇ) රියදුරු බලපත්‍ර එකක් රු. 1,340 බැගින් සැපයීමේ කොන්ත්‍රාත්තුව 2016 මාර්තු 26 දින අවසන් වී තිබුණද පහත සඳහන් කාර්යයන් ඉටු කිරීමට වගකිව යුතු පාර්ශ්වයන් විසින් කටයුතු කර නොතිබුණි.

- මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් මෙම බලපත්‍ර මුද්‍රණය පවරාගෙන එය පවත්වා ගෙන යාමට අවශ්‍ය පිළියම් යෙදීම.
- ඉහත පරිදි එය පවරාගෙන එය පවත්වා ගෙන යාමට නොහැකියාවක් වේ නම්, 2016 වර්ෂයේදී ගිවිසුම අවසන් වන බව ඊට පූර්ව වර්ෂ 07 කාලයක සිට දැනුවත් වී තිබුණු බැවින් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් මගින් නව සැපයුම්කරුවෙකු තෝරා ගැනීමට කටයුතු කිරීම.
- ඉහත කාරණා 02ක ම ඉටුකර ගැනීමට නොහැකි නම්, යටත් පිරිසෙයින් අදාළ සැපයුම්කරු සමග මිල ගණන් අඩුකර ගැනීම සම්බන්ධයෙන් සාකච්ඡා කර මිල අඩු කරවා ගැනීම.

ඉහත කාරණා ඉටු කිරීම වෙනුවට පවතින මිල ගණන් යටතේ ම අවස්ථා 05ක දී ගිවිසුම්ගත කාලය දීර්ඝ කරමින් 2020 ජූනි 30 දින දක්වාම එම සැපයුම්කරු වෙතම කොන්ත්‍රාත්තුව පවරා දී තිබුණි.

එනම්, අවස්ථා 05ක දී මාස 51ක කාලයක් සඳහා දින දීර්ඝ කිරීම් සිදුකළ එක් අවස්ථාවක දී හෝ මිල ගණන් සංශෝධන සම්බන්ධයෙන් සාකච්ඡා කර නොතිබුණි. කෙසේ නමුත්, 2020 ජූනි 01 දින සිට මාස 06ක් සඳහා එම සැපයුම්කරු විසින් එක් රියැදුරු බලපත්‍රයක මිල රු. 1,000ක් වන පරිදි රු. 340කින් අඩු කිරීමට එකඟ වී තිබුණි. දිවයිනේ උද්ධමනකාරී තත්ත්වයක් දිගින් දිගටම පැවැතිය දී සහ ශ්‍රී ලංකා රුපියලෙහි විදේශීය අගය අඛණ්ඩව පිරිහෙමින් පැවැතිය දී ඒකක මිල රු. 340කින් එනම්, සියයට 25කින් අඩු කිරීම සඳහා එකඟ වීම තුලින් නිරීක්ෂණය වන්නේ, 2009 වර්ෂයේ සිට එක් රියැදුරු බලපත්‍රයක් සඳහා අයකළ රු. 1,340ක ගැනුම් පිරිවැය තුළ අධික ලාභ ආන්තිකයක් අන්තර්ගතව පැවති බවය. මේ නිසා, විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය, පූර්ව ගිවිසුම් කාලය තුළ දී ම ක්‍රියාවට නැංවූයේ නම් හෝ සැපයුම්කරු සමග මිල ගණන් අඩු කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කළේ නම්, එම සැපයුම්කරු වෙතින් හෝ නව සැපයුම්කරුවෙකු වෙතින් හෝ අවම මිල ගණන් ඉදිරිපත් කිරීමට පවතින සම්භාවිතාව පුළුල් ය යන සැකය විගණනයේදී බැහැර කළ නොහැකි විය. එහෙත්, රාජ්‍ය මුදල්වල යහපත් භාවිතයක් වෙනුවෙන් කාර්යක්ෂමතාවකින් යුතුව එවැනි තීරණ ගැනීමට අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු කළමනාකාරීත්වය අපොහොසත් වීම නිසා 2016 මාර්තු මාසයේ සිට 2020 ජූනි මාසය දක්වා මාස 51ක කාලයක් තුළ මුද්‍රණය

කළ රියැදුරු බලපත්‍ර 3,075,625ක් වෙනුවෙන් පෞද්ගලික සමාගමක් වෙත සකසුරුවම් නොවන ලෙස ගලාගිය රාජ්‍ය මුදල් ප්‍රමාණය රු.1,045,712,500ක් බව නිරීක්ෂණය විය.

**3.3 මෙහෙයුම් දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සාවද්‍ය ලෙස ලියාපදිංචි කළ වාහන 10ක් පිළිබඳ තොරතුරු ලැබී තිබිය දී ත්, ඒ පිළිබඳ විධිමත් විමර්ශනයක් සිදුකර අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද කර තිබීම නිසා එම වාහන ද සාමාන්‍ය වාහන පරිදි ම අයිතිය මාරු කිරීම්, ආදායම් බලපත්‍ර ලබා ගැනීම ආදිය සිදු කරමින් පවතින බව නිරීක්ෂණය විය.

(ආ) වර්ෂයක් තුළ සිදුකළ වාහන හා වැසි අංක 115ක අසාධු ලේඛනගත කිරීම් හා මාස 06ක් තුළ සිදුකළ වාහන හා වැසි අංක 81ක අසාධු ලේඛනගත කිරීම් ඉවත් කිරීම් වෙනුවෙන් ලබා දුන් ලිඛිත අනුමැතීන් නොතිබුණි. එමෙන්ම, අනුමැතිය ලැබීමට පෙර වාහනවල අසාධු ලේඛනගත කිරීම් ඉවත් කර තිබුණු අවස්ථා ද නිරීක්ෂණය විය.

(ඇ) දෙපාර්තමේන්තුවේ කාර්මික අංශය විසින් 2015 දෙසැම්බර් සිට 2019 මැයි දක්වා කාලය තුළ දී වාහන 600ක ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා නිර්දේශ ලබා දී තිබුණ ද, ඒවා අවලංගු කිරීමට වාහන පැවරුම් අංශ විසින් කටයුතු කර නොතිබුණි. එහෙත්, එම කාලය තුළ කාර්මික අංශය නිර්දේශ නොකළ වාහන 223ක ලියාපදිංචිය අවලංගු කිරීමට තොරතුරු තාක්ෂණ අංශය හා වාහන පැවරුම් අංශ විසින් කටයුතු කර තිබුණි. එමෙන්ම, වාහනවල ලියාපදිංචිය අවලංගු කිරීම පරිගණක පද්ධතියේ සටහන් කර තිබුණ ද, ඒ කෙදිනක ද යන්න සඳහන් කර නොතිබුණි.

(ඈ) වාහන ලියාපදිංචි අංක අනුපිළිවෙලට නිකුත් කළ යුතු වුවත්, යම් යම් අංක හිස්ව තැබීමට කටයුතු කර තිබුණි. යම් අංකයක එකතුව 13ක් වන අංක හැර අනෙකුත් අංක හිස්ව තැබීම ප්‍රශ්ණගත විය. එම හිස් අංක භාවිතයෙන් සාවද්‍ය ලෙස වාහන ලියාපදිංචි කර තිබුණු බැවින් සියලු හිස් අංක පිළිබඳ තොරතුරු පුවත්පත් දැන්වීම් මගින් ප්‍රසිද්ධ කර එවැනි අක්‍රමිකතා අධෛර්යමත් කිරීමට ඇති හැකියාව පිළිබඳ සොයාබලා නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා රේගුව විසින් දඬ මුදල් ලෙස රේගු ගාස්තු අයකර නිදහස් කරන ලද මෝටර් වාහන, සාමාන්‍ය රථ ලෙස ලියාපදිංචි කිරීමේ දී රේගු ගාස්තු අයකළ බවට ලිපිය, විදේශ ලියාපදිංචි සහතිකය හා එහි ඉංග්‍රීසි පරිවර්තනය, පූර්ව අපනයනය සහතිකය ආදී ලියකියවිලි ඉදිරිපත් කළ යුතු බවට කමිටුවක් විසින් 2016 වර්ෂයේදී තීරණය කර තිබුණි. එම ලේඛන නොමැති

නම්, දෙපාර්තමේන්තුවේ කාර්මික අංශයේ අනුමැතිය මත CMT වැසි අංකයක් ලබා දීමට තීරණය කර තිබුණි. එනම්, පවතින වැසි අංකයට ආසන්නව CMT යනුවෙන් අක්ෂර 03ක් හා අනුක්‍රමික අංකයක් මුද්‍රණය කර ඊට දෙපසින් රාජ්‍ය ලාංඡන මුද්‍රණය කිරීමයි.

නිරීක්ෂණය වූ කරුණු පහත පරිදි ය.

(i) ඉහත සඳහන් ලේඛන නොමැති නම් පමණක් CMT වැසි අංක නිකුත් කිරීමට තීරණය කර තිබුණ ද, විවිධ හේතු පාදක කරගෙන 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අවස්ථා 80ක දී CMT වැසි අංක නිකුත් කර තිබුණි. මේ නිසා CMT අංක යටතේ සාවද්‍ය ලෙස වාහන ලියාපදිංචි කිරීමේ හැකියාවක් පවතින බව නිරීක්ෂණය විය.

(ii) මුද්‍රණය කළ යුතු CMT වැසි අංක 21ක් පිළිබඳ විස්තර 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාලය ඇතුළත දී රජයේ කර්මාන්ත ශාලාව වෙත දන්වා තිබුණ ද, එම වැසි අංක සහිත වාහන 2021 ජනවාරි දක්වා ම ලියාපදිංචි කර නොතිබුණි. එමෙන්ම, CMT වැසි අංක මුද්‍රණය කරන ලෙස රජයේ කර්මාන්ත ශාලාව වෙත දන්වා යවා තිබුණු වාහන 06ක් සාමාන්‍ය වාහන ලෙස ලියාපදිංචි කර තිබුණි.

(iii) නව වැසි අංකය ලබාදුන් පසු පැවති වැසි අංකය අවලංගු කළ යුතු වුවද, පැරණි හා නව වැසි අංක දෙකටම වාහන ලියාපදිංචි වී ඇති අවස්ථා 03ක් පැවැති අතර මෝටර් සයිකල් 02ක් එකම වැසි අංකයක් යටතේ ලියාපදිංචි කර තිබුණි.

(iv) රාජසන්තක කරන ලද මිට්සුබිසි පෙජරෝ රථයක් සම්බන්ධයෙන් රජයේ රස පරීක්ෂකගේ නිරීක්ෂණ සලකා බලා එම රථය අමතර කොටස් සඳහා විකිණීමට සුදුසු බව දෙපාර්තමේන්තුව විසින් අදාළ මහාධිකරණයට දන්වා තිබුණි. එහෙත්, එය මහාධිකරණයෙන් සිදු වූ වරදක් බැවින් එම රථය ලියාපදිංචි කර දෙන මෙන් වාහනය මිලදී ගත් තැනැත්තා විසින් මෝටර් රථ කොමසාරිස්වරයා වෙතින් කළ ඉල්ලීමට ප්‍රතිචාරිකව මෙම රථය CMT වැසි අංකයක් හා ලියාපදිංචි අංකයක් ලබා දී 2016 වර්ෂයේ ලියාපදිංචි කර තිබුණි. එහෙත්, එ වැනි වරදක් වූයේ නම්, එය නිවැරදි කළ බවට සාක්ෂි කිසිවක් නොවීය.

(v) දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ නිකුත් කර තිබුණු CMT වැසි අංක ලියාපදිංචි කිරීමේදී රේගුව විසින් දඩ මුදල් ලෙස රේගු ගාස්තු අයකර නිදහස් කරනු ලැබූ මෝටර් වාහනවල ලියාපදිංචි සහතිකයේ "Brought From Auction" ලෙස දැක්වීම වෙනුවට "Registration" යනුවෙන් සටහන් කර තිබුණු අවස්ථා 30ක් නිරීක්ෂණය විය.

(vi) CMT වැනි අංක වෙනුවෙන් රේගු සටහන්කර නොමැති විට දී නව රේගු සටහන්කර අංක නිර්මාණය කර පරිගණක පද්ධතියට ඇතුළත් අවස්ථා 08ක් නිරීක්ෂණය විය. මේ සඳහා අනුමත කරගත් නෛතික ප්‍රතිපාදන කිසිවක් නොවිය.

### 3.4 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

දෙපාර්තමේන්තුව වෙත 2019 හා 2020 ගිණුම් වර්ෂ වෙනුවෙන් ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 07කට පිළිතුරු 2021 මාර්තු 30 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

## 4. තිරසාර සංවර්ධනය

2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ 3.6, 3.9, 11.2 සහ 11.6 යන අරමුණු ළඟාකර ගැනීම උදෙසා සිය සම්පත් කාර්යක්ෂමව මෙහෙයවිය යුතු විය. එහෙත්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් එම අරමුණු හඳුනාගෙන තිබුණ ද, ඒවා ඉටුකර ගැනීමට අදාළ වැඩසටහන් සකස් කර නොතිබුණි.

## 5. මානව සම්පත් කළමනාකරණය

### 5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට අදාළව 2020 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 30 | 27 | 03 |
| (ii) තෘතියික මට්ටම | 21 | 04 | 17 |
| (iii) ද්විතියික මට්ටම | 823 | 727 | 96 |
| (iv) ප්‍රාථමික මට්ටම | 138 | 121 | 17 |
| එකතුව | 1012 | 879 | 133 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 133 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ පවතින කාර්යයන්හි පුළුල් වීම හේතු ලෙස දක්වා මුදල් රෙගුලාසි පරිශිෂ්ඨ යටතේ කාර්ය මණ්ඩල යෝජනා ඉදිරිපත් කරමින් නව තනතුරක් ඇතිකර ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමු පන්තියේ නිලධාරියෙකු බඳවාගෙන 2020 වර්ෂය වන විට වර්ෂ 04ක් ගත වී තිබුණ ද, ඉදිරිපත් කළ කාර්ය මණ්ඩල යෝජනා පරිදි එම නිලධාරියාගෙන් ඉටුකර ගැනීමට අපේක්ෂා කළ කිසිදු කාර්යයක් ඉටු වී ඇති බවක් නිරීක්ෂණය නොවීය. එසේම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කොමසාරිස්වරයෙකු ලෙස, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය සම්බන්ධයෙන් ඔහු සතු අධ්‍යාපනික සුදුසුකම් හා වෘත්තිය කුසලතාවන් කිසිවක් තහවුරු කරගත නොහැකි විය.

ආර්.ආර්.එම්.අබේසිංහ බණ්ඩා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.